# සමුපකාර තොග වෙළඳ සංස්ථාව

## 2011.12.31 දිනෙන් අවසන් වසර සඳහා වාර්ෂික ගිනුම්

# සමුපකාර තොග වෙළඳ සංස්ථාව

## වාර්ෂික වාර්තාව

## 2011

ඇතුල් පිටු


| | |
|---|---|
| අධ්‍යක්ෂ මණ්ඩල සහ විධායක නිලධාරීන් | 01 |
| සභාපතිතුමාගේ සමාලෝචනය | 02 |
| අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව | 03 - 04 |
| වර්ෂය සංක්ෂේපයෙන් | 05 |
| මූල්‍ය ප්‍රකාශන | 06 - 09 |
| මූල්‍ය ප්‍රකාශන වලට සටහන | 10 - 41 |
| විගණකාධිපතිගේ වාර්තාව | 42 - 59 |
| විගණකාධිපතිගේ වාර්තාව පිළිබඳ සභාපතිගේ නිරීක්ෂණ | 60 - 70 |

# සමුපකාර තොග වෙළඳ සංස්ථාව

## අධ්‍යක්ෂ මණ්ඩලය - 2011

| | |
|---|---|
| සභාපති | :- එරාජ් ටී.ප්‍රනාන්දු මහතා |
| ක්‍රියාකාරී අධ්‍යක්ෂ | :- කේ.එම්.එම්.ෂාකීර් මහතා |
| අධ්‍යක්ෂවරුන් | :- කේ.එම්.එම්.ජයතිලක මහතා<br>අධ්‍යක්ෂ - (භාණ්ඩාගාර නියෝජිත)<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,<br>විගණන කළමණාකරන දෙපාර්තමේන්තුව<br>මහා භාණ්ඩාගාරය |
| | :- පී.ධර්මදාස මහතා<br>අධ්‍යක්ෂ (අමාත්‍යාංශ නියෝජිත)<br>අතිරේක ලේකම්<br>සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය<br>(2011.11.09 දින සිට ක්‍රියාත්මක වන පරිදි විශ්‍රාම ගන්නා ලදි.) |
| | :- එම්.පී.එස්.එම්.මොහොමඩ් ජවාඩ් මහතා |
| | :- ඩී.ඒ.බුල්ජන්ස් මහතා |
| | :- ඩී.සී.එල්.ලංකාතිලක මහතා |
| | :- එම්.එම්.පී.කේ.මායාදුන්නේ මහතා<br>අධ්‍යක්ෂ (අමාත්‍යාංශ නියෝජිත)<br>අතිරේක ලේකම් (සැලසුම් හා සංවර්ධන)<br>සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය<br>(2011.11.23 දරණ අමාත්‍යාංශ ලිපිය අනුව) |

## 2011 වාර්ෂික වාර්තාව
## සභාපතිගේ පණිවිඩය

කර්මාන්ත හා වාණිජ කටයුතු ගරු අමාත්‍යතුමා විසින් 2015 අගෝස්තු 15 දින සිට සමූපකාර තොග වෙළඳ සංස්ථාවේ සභාපති වශයෙන් මා පත් කරන ලදි. එම පත්කිරීමෙන් පසුව මා විසින් ආයතනයේ සියළු ක්ෂේත්‍රයන් සම්බන්ධව දීර්ඝ වශයෙන් අධ්‍යයනය කළ අතර, එහිදී හඳුනාගත් ගිණුම්කරණ කටයුතු සහ ව්‍යාපාරික කටයුතු වල දුර්වලතාවයන් සහ අඩුපාඩු නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගත්තා ලදි.

ඒ අනුව 2012, 2013, සහ 2014 වර්ෂයන් සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ කටයුතු කඩිනමින් නිම කිරීමටත්, පසුගිය කාලයේ වී අලෙවි මණ්ඩලය සමඟ සිදුකර තිබූ ගණුදෙනු සටහන් කිරීමේදී සිදුවී ඇති ගිණුම්කරණ දෝෂයන් හඳුනාගෙන නිවැරදි තත්වය හෙළිදරව් කරගැනීමටත් පෞද්ගලික වී මෝල් හිමියන්ගෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සිදුකරන ලදි. තවද ආයතනයේ ප්‍රධානතම ආදායම් මාර්ගය වන ආයතනය සතු දේපළ කුලියට දීමෙන් උපයන බදු කුලී ආදායම වැඩිකර ගැනීම සඳහා පැවති ගිවිසුම් අළුත් කිරීමටත් ආයතනයට වැඩි ප්‍රතිලාභයක ලැබෙන පරිදි නව ගිවිසුම් සඳහා එළඹීමටත් කටයුතු කරන ලදි.

2014 වසරේ සිට නිෂ්කාර්යව පැවති පත්තෙගමුව සහ හිඟුරක්ගොඩ පිහිටි සහල් සැකසුම් මධ්‍යස්ථාන වල සහල් නිෂ්පාදන කටයුතු නැවත ආරම්භ කර ඇති අතර ලංකා සතොස ආයතනය සමග තිබෙන ව්‍යාපාරික බැඳීම් තවදුරටත් වර්ධනය කරගනිමින් සහල් ඇතුළු අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය කිහිපයක් අප ආයතනය මගින් සැපයීමට අවශ්‍ය පසුබිම සකස් කරගෙන ඇත.

පසුගිය කාලයේදී කල්බදු ක්‍රමයට මිලදී ගෙන තිබෙන ලොරි රථ උපරිම වශයෙන් ලංකා සතොස ආයතනයේ ප්‍රවාහන අවශ්‍යතා වෙනුවෙන් යොදවා ඇති අතර එමගින් උපයන ආදායම් වැඩිකර ගැනීමට කටයුතු කරමින් පවතී.

මෙම කටයුතු සාර්ථකව කරගැනීම තුලින් ආයතනය මුහුණදී සිටින මූල්‍ය දුෂ්කරතා සමනය කරගැනීමටත් ආයතනය සතු මානව හා භෞතික සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලබාගෙන රාජ්‍ය ව්‍යාපාර ක්ෂේත්‍රය තුල ඵලදායී ආර්ථික ක්‍රියාවලියක යෙදෙන ආයතනයක් බවට සතොස ආයතනය නැවත පත් කිරීමටත් අපේක්ෂා කරමු.

අතිගරු ජනාධිපතිතුමාගේ සහ ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රතිපත්තිය මත මෙම අරමුණ ඉටුකර ගැනීම සඳහා කර්මාන්ත හා වාණිජ කටයුතු ගරු අමාත්‍ය රිෂාඩ් බදියුදීන් මැතිතුමාගෙන් අප වෙත ලැබෙන මහ පෙන්වීම සහ පූර්ණ අනුග්‍රහය මා මෙම අවස්ථාවේදී ඉතාම ගෞරවයෙන් හා කෘතවේදීව සිහිපත් කරමි.

අපගේ මෙම අරමුණු වෙනුවෙන් නිරතුරුවම සහයෝගය සහ ධෛර්යය ලබාදෙන ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාත්, අමාත්‍යංශ ලේකම්තුමා ඇතුළු අමාත්‍යංශයේ සියළුම නිලධාරි මණ්ඩලයටත්, භාණ්ඩාගාරයේ සියළුම නිලධාරීන්ටත් මාගේ ගෞරවණීය ස්තුතිය පුද කරමි.

මේ සඳහා මා වෙත ශක්තිය සහ ධෛර්යය හා සහයෝගය ලබාදෙන අධ්‍යක්ෂ මණ්ඩලය, ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන්, ආයතනයේ විවිධ අංශ වලට අනුයුක්ත සියළුම කාර්ය මණ්ඩලයත් මේ අවස්ථාවේදී ස්තුති පූර්වකව සිහිපත් කරමි.



එම්.රිස්වාන් හමීම් ,
සභාපති
2016.01.04.

## 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව.

1971 අංක 38 දරණ මුදල් පනතේ අංක 14 වගන්ති ප්‍රකාර සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ 2011.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මේ සමඟ ඉදිරිපත් කරනු ඇත.

01. පොදු කරුණු :-

මූලික ක්‍රියාකාරකම්

1949 අංක 47 දරණ පනතින් ස්ථාපිත කරන ලද සමුපකාර තොග වෙළඳ සංස්ථාව (සතොස නමින් වඩාත් ප්‍රචලිත) සිය ව්‍යාපාරික කටයුතු 1950 ජූලි 01 දින සිට ආරම්භ කරනු ලැබ ඇත.

ආරම්භයේදී සතොසෙහි මූලික පරමාර්ථය වනුයේ ද අත්‍යාවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය වෙනුවෙන් තොග සහ සිල්ලර වෙළඳ ආයතනයක් වශයෙන් කටයුතු කරනු ලැබීමයි.

එහෙත්, වසර 50 කට වඩා වැඩි කාලයක් ශ්‍රී ලාංකික පාරිභෝගික සහ ගොවි ජනතාවගේ සුභසිද්ධිය සඳහා ව්‍යාපාර කටයුතු සිදු කිරීමේදී මුහුණ දෙන ලද දැඩි මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් ඉදිරිපත් කරන ලද 2004 වර්ෂයේ හා 2006 වර්ෂයේ ස්වේච්ඡා වන්දි යෝජනා ක්‍රමයෙන් පසුව ලංකා සතොස ආයතනය වෙත මූලික පහසුකම් සැලසීම පෙරදැරිව කටයුතු කරන අතර,මේ වන විට සහල් සැකසුම් මධ්‍යස්ථානයන්හි නිෂ්පාදිත සහල් සැපයීම, අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය හිඟතාවයකින් තොරව සැපයීමට දායක වීම සහ ප්‍රවාහන, ආරක්ෂක, ඇසුරුම් සේවාවන් සැපයීම සිදු කෙරේ.

02. ව්‍යාපාරික කටයුතු සමාලෝචනය කිරීම

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාවේ ද කොටසක් වන සභාපතිගේ අදහස් දැක්වීම් යටතේ ආයතනය පිළිබඳව වර්තමාන තත්ත්වය පිළිබඳව සඳහන් කර ඇත.

ඒ අනුව, දැනට ප්‍රධානතම ආදායම් මාර්ගය වී තිබෙන ලංකා සතොස ආයතනයට සහ වෙනත් රාජ්‍ය හා පෞද්ගලික ආයතන වෙත ආයතනය සතු දේපළ කුලියට දීමෙන් ආදායම් ඉපයීම තවදුරටත් වර්ධනය කර ගනිමින් ආයතනය සතු ප්‍රවාහන අංශය වැඩිදියුණු කිරීමෙන් ලංකා සතොස වෙත වඩාත් සාධාරණ සහ කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක් ලබා දීමත්, පන්නෙගමුව සහ හිඟුරක්ගොඩ පිහිටි සහල් සැකසුම් මධ්‍යස්ථානයන්හි නිෂ්පාදන කටයුතු ආරම්භ කර උසස් තත්වයේ සහල් සාධාරණ මිලකට පාරිභෝගික ජනතාව වෙත ලංකා සතොස අලෙවි ජාලය ඔස්සේ බෙදාහැරීමටත්, ඒ තුලින් සහල් වෙළඳපොළ සහ මිළ රජය වෙනුවෙන් පාලනය කළ හැකි හස්තය බවට පත්වීමටත් අපේක්ෂිතයි.

2011.12.31 දිනට සේවක සංඛ්‍යාවේ විශ්ලේෂණය මෙසේය.

1. විධායක - 07
2. ලිපිකරු සහ සමාන්තර ශ්‍රේණි - 54
3. වෙනත් සහායක ශ්‍රේණි - 234

## 03. 2011.12.31 දිනට ආයතනයට එරෙහිව පැවති නඩුවල තත්ත්වය

| | 2011.01.01 දිනට පැවති නඩු | 2011 වර්ෂය තුළදී අවසන් කළ නඩු | තවදුරටත් විභාග වන නඩු |
|---|---|---|---|
| ඉහළ උසාවිය | 15 | 04 | 11 |
| දිස්ත්‍රික් උසාවි | 13 | 03 | 10 |
| මහේස්ත්‍රාත් උසාවි | 18 | 06 | 12 |
| කම්කරු විනිශ්චය සභා නඩු | 14 | 05 | 09 |
| කම්කරු පරීක්ෂණ | 10 | 02 | 08 |
| බේරුම්කරන නඩු | 02 | 01 | 01 |
| බහා තැබූ නඩු | 14 | - | 14 |
| අභියාචනා නඩු | 01 | - | 01 |

## 04. අඛණ්ඩ පැවැත්මේ සංකල්පය

පෙර පැවති රු.මිලියන 8885 ක් වූ සම්මුච්චිත පාඩු සහ මිලියන 864 ක් වූ කාරක ප්‍රාග්ධන ඌනතා හේතුවෙන සතොස ආයතනයට, ණය දෙන ආයතන වලින් මූල්‍ය සහායන් ලබා ගැනීමට නොහැකි වී ඇති තත්ත්වය යටතේ පෙර පැවති මූල්‍ය බැරකම් දැරීමට ආයතනයට හැකියාවක් නැත. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය තුළදී සතොස සතු අක්‍රීයව පැවති ගොඩනැගිලි කුලියට දීමට කටයුතු කිරීමෙන් සහ තිබූ වත්කම් ඉවත් කිරීමට කටයුතු කිරීමෙන් වර්තමාන කාරක සභාව සඳහා අවශ්‍ය කරුණු ලැබූ අතිරේක මුදල් උත්පාදනය කරගෙනය. එබැවින්, අධ්‍යක්ෂ මණ්ඩල මතය වනුයේ ආයතනයේ වෙළඳ ක්‍රියාදාමය අඛණ්ඩව පැහැදිලිව පෙනෙන ඉදිරි කාලයක් තුල පවත්වාගෙන යන සහ එහි වර්තමාන මූල්‍ය වගකීම් මෙම මූල්‍ය වාර්තා අත්සන් තබන දිනයේ සිට අඩුම වශයෙන් මාස 12 ක කාල සීමාවක් තුල නියමිත දින වලදී අඛණ්ඩව දරණ බැවින්, ආයතනයේ මූල්‍ය වාර්තා අඛණ්ඩව සංකල්පනය මත සකස් කිරීම වඩාත් උචිත බවයි.

## 05. විගණකවරුන්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තිය සමඟ කියවියයුතු 1971 අංක 38 දරණ මුදල් පනතේ 13(01) ප්‍රකාරව ආයතනයේ විගණක විය යුත්තේ රජයේ විගණකාධිපතිය.

## 06. ස්තුතිය

සතොස ආයතනයට අගනා මගපෙන්වීම සහ සහාය ලබා දීම සඳහා අතිගරු ජනාධිපතිතුමාට, ගරු අග්‍රාමාත්‍යතුමාට, කර්මාන්ත සහ වාණිජ ගරු අමාත්‍යතුමාට, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාට, අමාත්‍යාංශ ලේකම්තුමාට සහ අමාත්‍යංශයේ සියළුම නිලධාරී මහතුන්ට ස්තුති වන අතර, වර්ෂය තුල අපට සහයෝගය ලබා දුන් මුදල් අමාත්‍යාංශයේ, භාණ්ඩාගාරයේ සහ අනෙකුත් අමාත්‍යාංශ වල සියළු කාර්යමණ්ඩලිකයන්ටද අපි ස්තුතිවන්ත වෙමු.

අපගේ වඩාත්ම වැදගත් සම්පත අපගේ කාර්ය මණ්ඩලයයි. ගත වූ වසර තුල ඉටු කළ සේවාව සහ දැක්වූ සහයෝගය පිළිබඳව සියළු කාර්ය මණ්ඩලිකයන්ට අපි ස්තුතිවන්ත වෙමු.

අප වෙත අඛණ්ඩ අනුග්‍රහයක් දැක්වූ අගනා පාරිභෝගික ජනතාවට අධ්‍යක්ෂ මණ්ඩලය සිය ස්තුතිය පුද කර සිටී. තවද, විවිධ ව්‍යවස්ථාපිත ආයතන පුද්ගලික අංශයේ ආයතනයන්ට ද, අපේ බැංකුකරුවන් වෙත ද හිමිවේ.

සමූපකාර තොග වෙළඳ සංස්ථාව

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

ආදායම් ප්‍රකාශනය

(සියලුම සංඛ්‍යා ශ්‍රීලංකා රුපියල් වලින් දක්වා තිබේ.)

| | සටහන් | 2011 | 2010 |
|---|---|---|---|
| ආදායම් | 2 | 313,800,611 | 182,821,640 |
| අඩුකලා : විකුණුම් පිරිවැය | 3 | 261,061,999 | 180,827,758 |
| දළ ලාභය/(අලාභය) | | **52,738,612** | **1,993,882** |
| වෙනත් ආදායම් | 4 | 183,633,557 | 186,625,740 |
| | | 236,372,169 | 188,619,622 |
| පරිපාලන සහ ආයතනික | 5 | 165,586,679 | 78,857,485 |
| විකුණුම් සහ බෙදා හැරීම් | 6 | 38,067,612 | 86,462,024 |
| | | **203,654,291** | **165,319,509** |
| **ලාභය/(අලාභය)මෙහෙයුම් වලින්** | | **32,717,878** | **23,300,113** |
| අඩුකලා : මූල්‍ය පිරිවැය | 7 | 22,510,995 | 21,000,000 |
| **ලාභය/(අලාභය) භාණ්ඩාගාර බැඳුම්කර පොලී ගැලපීමට පෙර** | | **10,206,883** | **2,300,113** |
| අඩුකලා :භාණ්ඩාගාර බැඳුම්කර පොලී | | **323,812,668** | **323,812,668** |
| ලාභය/අලාභය අය බදු ගෙවීමට පෙර | | **(313,605,785)** | **(321,512,555)** |
| අඩුකලා : අයබදු සඳහා ප්‍රතිපාදන | | | |
| ලාභය/ අලාභය අයබදු ගෙවීමෙන් පසු වර්ෂය සඳහා | | **(313,605,785)** | **(321,512,555)** |

සමුපකාර තොග වෙළඳ සංස්ථාව
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ශේෂ පත්‍රය
(සියලුම සංඛ්‍යා ශ්‍රී ලංකානු රුපියල් වලින් දක්වා තිබේ.)

| | සටහන් | 2011 | 2010 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල ,යන්ත්‍ර සහ උපකරණ | 9 | 1,133,266,809 | 1,110,577,321 |
| ආයෝජන | 10 | 181,852,410 | 181,852,410 |
| එකතුව | | **1,315,119,219** | **1,292,429,731** |
| **ජංගම වත්කම්** | | | |
| ඉන්වෙන්ට්‍රිය | 11 | 137,862,900 | 110,518,118 |
| අත්තිකාරම් ගෙවීම් සහ අය විය යුතු මුදල් | 12 | 31,738,018 | |
| කෙටි කාලීන ණය සහ වෙනත් අයවිය යුතු මුදල් | 13 | 229,248,540 | 251,112,319 |
| වෙළඳ සහ වෙනත් ණයහිමියන් | 14 | 489,033,342 | 188,940,497 |
| ආශ්‍රිත පාර්ශවයන් සමඟ ගනුදෙනු | 15 | | 3,997,509 |
| බැංකුවේ ඇති මුදල් | 16 | 175,491,153 | 55,269,626 |
| අතැති සහ බැංකුවේ ඇති මුදල් | 17 | 28,927,667 | 6,088,252 |
| එකතුව | | **1,092,301,620** | **615,926,321** |
| මුළු වත්කම් | | **2,407,420,838** | **1,908,296,052** |
| **ව්‍යාපාර කොටස් සහ වගකීම්** | | | |
| **ප්‍රකාශිත ප්‍රාග්ධනය** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | | 1,056,590 | 1,056,590 |
| සංචිත | 18 | 1,700,815,901 | 1,700,815,901 |
| ප්‍රතිව්‍යුහගත සංචිත | 19 | 2,323,728,130 | 2,323,728,130 |
| රඳවාගන්නා ලද ඉපැයුම් | | (10,541,319,225) | (10,195,851,709) |
| එකතුව | | **(6,515,718,604)** | **(6,170,251,088)** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| බැඳුම්කර පොළී සඳහා භාණ්ඩාගාර ප්‍රදාන | 20 | 2,482,355,130 | 2,158,542,462 |
| බැඳුම්කර වගකීම් | 21 | 4,597,000,000 | 4,597,000,000 |
| ආශ්‍රිත පාර්ශවයන් සමඟ ගනුදෙනු | 15 | 161,559,988 | |
| විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම | 22 | 30,112,068 | 26,193,505 |
| බදු ණයහිමියන් | 23 | 17,813,530 | |
| | | 7,288,840,716 | 6,781,735,967 |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ ණයහිමියන් සහ වෙනත් ලැබීම් | 24 | 1,196,678,438 | 1,036,094,000 |
| සමුපකාර කොමසාරිස් වෙත ගෙවිය යුතු ණය | 25 | 220,078,867 | 50,000,000 |
| බැංකු ණය | 26 | 183,131,255 | 209,231,254 |
| බැංකු අයිරා | 27 | 34,410,165 | 1,485,919 |
| එකතුව | | 1,634,298,725 | 1,296,811,173 |
| මුළු ව්‍යාපාර කොටස් සහ වගකීම් | | **2,407,420,838** | **1,908,296,052** |

මෙම මූල්‍ය ප්‍රකාශනවල අනුකල කොටසකින් ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන් දැක්වේ.

................................ ................................

සභාපති මූල්‍ය අංශ ප්‍රධානි

සමූපකාර තොග වෙළඳ සංස්ථාව

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා

ව්‍යාපාර කොටස් වෙනස්වීම් ප්‍රකාශනය

(සියලුම සංඛ්‍යා ශ්‍රීලංකා රුපියල් වලින් දක්වා තිබේ.)

| විස්තරය | ප්‍රකාශිත ප්‍රාග්ධනය | ප්‍රාග්ධන සංචිතය | පොදු සංචිතය | ණය බේරුම් සංචිතය | වාහන ප්‍රතිස්ථාපන සංචිතය | ප්‍රතිප්‍රමාණ අතිරික්තය | ප්‍රතිව්‍යුහගත කිරීම් සංචිතය | සමුච්චිත ලාභය /අලාභය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2010 .01.01 දිනට ශේෂය | 1,056,590 | 32,444,879 | 94,477,411 | 300,289,603 | 72,218,000 | 1,201,386,008 | 3,616,293,377 | (8,885,159,279) | (3,566,993,411) |
| පූර්ව වර්ෂයෙහි භාණ්ඩාගාර බැඳුම්කර සඳහා ගැලපීම් | | | | | | | | (607,767,284) | (607,767,284) |
| **2010.01.01 දිනට ගැලපූ ශේෂය (සටහන අ)** | **1,056,590** | **32,444,879** | **94,477,411** | **300,289,603** | **72,218,000** | **1,201,386,008** | **3,616,293,377** | **(9,492,926,563)** | **(4,174,760,695)** |
| පූර්ව වර්ෂයෙහි ව්‍යතිරේක භාණ්ඩ | | | | | | | | (381,412,591) | (381,412,591) |
| ගැලපීම්2010 වර්ෂය සඳහා ලාභ/(අලාභය) | | | | | | | | (321,512,555) | (321,512,555) |
| මාරුකිරීම් | | | | | | | 704,070,881 | | 704,070,881 |
| භාණ්ඩාගාර වගකීම් වෙත මාරු කිරීම් | | | | | | | (1,996,636,128) | | (1,996,636,128) |
| **2011.01.01 දිනට ශේෂය** | **1,056,590** | **32,444,879** | **94,477,411** | **300,289,603** | **72,218,000** | **1,201,386,008** | **2,323,728,130** | **(10,195,851,709)** | **(6,170,251,088)** |
| පූර්ව වර්ෂයේ ගැලපීම් | | | | | | | | **(31,861,731)** | **(31,861,731)** |
| මාරුකිරීම් | | | | | | | | | |
| 2011 වර්ෂය සඳහා ලාභය | | | | | | | | (313,605,785) | (313,605,785) |
| **2011.12.31 දිනට ශේෂය** | **1,056,590** | **32,444,879** | **94,477,411** | **300,289,603** | **72,218,000** | **1,201,386,008** | **2,323,728,130** | **(10,541,319,225)** | **(6,515,718,604)** |

1) 1997.12.31 දිනසිට ක්‍රියාත්මක වන පරිදි ආදායම් බදුවලින් තොර ඉඩම්සහ ගොඩනැඟිලි විවෘත වෙළඳ පොළ ගාස්තු යටතේ නැවත තක්සේරු කරන ලදී .තක්සේරුකරණය සිදුකරන ලද්දේ ස්වාධීන තක්සේරු කරුවන් විසිණි. රුපියල් 1,159,246,438/= ක අතිරික්තය ප්‍රතිප්‍රමාණ අතිරික්ත ගිණුමට මාරු කරන ලදී.

2) 2009.12.31 සහ 2010.12.31 දින සිට පිළිවෙලින් ක්‍රියාත්මක වන පරිදි මෝටර් වාහන විවෘත වෙළඳ පොළ ගාස්තු යටතේ නැවත තක්සේරු කරන ලදී . ස්වාධින තක්සේරු කරුවන් විසින් තක්සේරු කිරීම සිදුකරන ලද අතර රුපියල් 6,192,470/= අතිරික්තය ප්‍රතිප්‍රමණ අතිරික්ත ගිණුමට මාරු කරන ලදී.

## සමූපකාර තොග වෙළඳ සංස්ථාව

**2001 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**(සියළුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා තිබේ)**

සටහන (අ) භාණ්ඩාගාර බැඳුම්කර සඳහා පූර්ව වර්ෂයේ ගැලපීම්

| විස්තර | වර්ෂය සඳහා ලාභය/(අලාභය) | සමුච්චිත අලාභය |
|---|---|---|
| **2002.12.31 දිනට ශේෂය** | | **(5,694,706,392)** |
| 2003.01.01 දිනට ශේෂය | (1,162,050,602) | |
| භාණ්ඩාගාර බැඳුම්කර පොළී | 4,209,564,684 | |
| භාණ්ඩාගාර බැඳුම්කර වට්ටම් අගය | 1,522,544,041 | |
| භාණ්ඩාගාර බැඳුම්කර අගය | (4,397,000,000) | 173,058,123 |
| **2003.12.31 දිනට ශේෂය** | | **(5,521,648,269)** |
| 2004 වර්ෂය සඳහා ලාභය | **(970,929,555)** | |
| 2004 වර්ෂයේ ක්‍රමක්ෂය වූ පොළිය | **(323,812,668)** | **(1,294,742,223)** |
| **2004.12.31 දිනට ගැලපූ ශේෂය** | | **(6,816,390,492)** |
| 2005 වර්ෂය සඳහා ලාභය | **(164,723,497)** | |
| 2005 වර්ෂයේදී ක්‍රමක්ෂයවූ පොළිය | **(323,812,668)** | **(488,536,165)** |
| **2005.12.31 දිනට ගැලපූ ශේෂය** | | **(7,304,926,657)** |
| 2006 වර්ෂය සඳහා ලාභය | **(556,539,593)** | |
| 2006 වර්ෂයේදී ක්‍රමක්ෂයවූ පොළිය | **(323,812,668)** | **(880,352,261)** |
| **2006.12.31 දිනට ගැලපූ ශේෂය** | | **(8,185,278,918)** |
| 2007 වර්ෂය සඳහා ලාභය | **(4,854,299)** | |
| 2007 වර්ෂයේදී ක්‍රමක්ෂයවූ පොළිය | **(323,812,668)** | **(328,666,967)** |
| **2007.12.31 දිනට ගැලපූ ශේෂය** | | **(8,513,945,885)** |
| 2008 වර්ෂය සඳහා ලාභය | **56,294,429** | |
| 2008 වර්ෂයේදී ක්‍රමක්ෂයවූ පොළිය | **(323,812,668)** | **(267,518,239)** |
| **2008.12.31 දිනට ගැලපූ ශේෂය** | | **(8,781,464,124)** |
| 2009 වර්ෂය සඳහා ලාභය | **(387,649,771)** | |
| 2009 වර්ෂයේදී ක්‍රමක්ෂයවූ පොළිය | **(323,812,668)** | **(711,462,439)** |
| **2009.12.31 දිනට ගැලපූ ශේෂය** | | **(9,492,926,563)** |

## සමූපකාර තොග වෙළඳ සංස්ථාව

## මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා<br>(සියළුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා තිබේ) | 2011 | 2010 |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්** | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ඉපයූ මුදල් (සටහන අ) | 198,987,150 | 314,993,724 |
| පූර්ව වර්ෂයේ ගැලපීම් | (31,861,731) | (381,412,591) |
| ගෙවන ලද පාරිතෝෂිත | (518,470) | (902,870) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ගලාඒම / (ගලායාම)** | **166,606,949** | **(67,321,737)** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදලි සංවරනය** | | |
| දේපල ,යන්ත්‍රෝපකරණ සහ උපකරණ මිලදී ගැනීම | 60,155,787 | (2,920,801) |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලැබීම් | 11,972,000 | 30,554,635 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ගලාඒම / (ගලායාම)** | **48,183,787** | **27,633,834** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් මුදල් ගලාඒම** | | |
| කල්බදු ණයහිමියන් | 17,813,531 | - |
| කෙටිකාලීන ණයට ගැනීම් වැඩිවීම් | (26,099,999) | 50,000,000 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ගලාඒම / (ගලායාම)** | **(8,286,468)** | **50,000,000** |
| **මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම් / අඩුවීම** | 110,136,694 | 10,312,097 |
| **වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ** | 59,871,961 | 49,559,864 |
| **වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් සමාන දෑ** | **170,008,655** | **59,871,961** |

| (සියළුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා තිබේ) | 2011 | 2010 |
|---|---|---|
| **සටහන අ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උපයන ලද මුදල්** | | |
| බදු ගෙවීමට සහ විශේෂ අයිතමයන්ට පෙර දළ ලාභය | (313,605,785) | (321,512,555) |
| ක්ෂයවීම | 28,505,697 | 19,576,219 |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභය / (අලාභය) | (3,071,400) | (30,709,278) |
| පාරිතෝෂිත ප්‍රතිපාදන | 4,437,033 | 4,781,414 |
| ණයහිමියන්ගෙන් කපා හැර සංචිතයට මාරුකිරීම් | - | 542,164,547 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය /අලාභය** | **(283,734,455)** | **214,300,347** |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්කම්** | | |
| භාණ්ඩ වට්ටෝරුවෙහි (වැඩිවීම) / අඩුවීම | (27,344,782) | (80,575,418) |
| වෙළඳාමෙහි සහ වෙනත් ලැබීම් (වැඩිවීම) / අඩුවීම | (305,969,575) | 301,771,203 |
| වෙළඳ සහ වෙනත් ගෙවීම්(වැඩිවීම) / අඩුවීම | 330,663,305 | (444,315,076) |
| භාණ්ඩාගාර ප්‍රදාන(වැඩිවීම) / අඩුවීම | 323,812,668 | 323,812,668 |
| වෙනත් ගෙවීම් (වැඩිවීම) / අඩුවීම | 161,559,988 | - |
| **එකතුව** | **482,721,605** | **100,693,377** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උපයන ලද මුදල්** | **198,987,150** | **314,993,724** |

| **සටහනආ මුදල් සහ මුදල් සමාන දෑ** | **31.03.2011** | **31.12.2010** |
|---|---|---|
| අතැති මුදල් සහ බැංකු මුදල් | 204,418,820 | 61,357,878 |
| බැංකු අයිරාව | (34,410,165) | 1,485,919 |
| **ශුද්ධ මුදල් හා සමාන දෑ** | **170,008,655** | **59,871,961** |

**සමූපකාර තොග වෙළඳ සංස්ථාව**

**2011 .12.31 දිනෙන් අවසන් වන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්**

**සටහන 1- ගිණුම් ප්‍රතිපත්ති**

**සංයුක්ත තොරතුරු**

**පොදු**

සමූපකාර තොග වෙළඳ සංස්ථාව හෙවත් සතොස 1949 අංක 47 දරණ පාර්ලිමේන්තු පනත යටතේ රාජ්‍ය ආයතනයක් වශයෙන් ස්ථාපනය කරන ලදී. ලියාපදිංචි කාර්යාලය සහ සේවා සපයන ප්‍රධාන ස්ථානය කොළඹ 02 වොක්ෂෝල් වීදියේ අංක 27 දරණ ස්ථානයෙහි පිහිටා තිබේ.

**ප්‍රවර්තන ව්‍යාපාරය**

ඉකුත් කාලයේදී මෙම ආයතනයෙහි සැළකියයුතු සමුච්චිත අලාභ පැවති අතර ශේෂ පත්‍රයේ දිනයට අනුව එහි ජංගම වගකීම් ප්‍රමාණය ජංගම වත්කම් ප්‍රමාණයට වඩා රුපියල් මිලියන 625 කින් වැඩි විය. එමෙන්ම කල් ඉකුත්වූ ණය හේතු කොටගෙන මෙම ආයතනයට බැංකු ආයතන වලින් මූල්‍ය සහාය ලබා ගත නොහැකිය . කෙසේ නමුත් සමාලෝචිත වර්ෂයේදී මෙම ආයතනය සමූපකාර සමිති සහ පෞද්ගලික ආයතන කිහිපයක් සමඟ එක්ව තොග වෙළඳ මෙහෙයුම් වල නිරතවූ අතර අකර්මන්‍ය වත්කම් විකිණීමෙන් සහ සමූපකාර සංවර්ධන කොමසාරිස් සහ සමූපකාර රෙජිස්ටාර් විසින් ලබා දෙන ලද රුපියල් මිලියන 50 ක මුදල යොදාගෙන සියලුම මූල්‍ය ප්‍රසම්පාදන කටයුතු සිදු කරන ලදී. ඒ අනුව මෙම ආයතනය ඉදිරි කාලයේදී මෙහෙයුම් කටයුතු සිදුකරනු ඇතැයි සහ මූල්‍ය වගකීම් මෙම මූල්‍ය ප්‍රකාශන අත්සන් කර අවම වශයෙන් මාස 12 ක් ඉකුත්වීමට ප්‍රථම ඉටු කරනු ඇතැයි යන්න උපකල්පනය කරමින් ප්‍රවර්තන ව්‍යාපාර පදනම මත මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සුදුසුය යන මතයෙහි අධ්‍යක්ෂකවරු සිටිති.

**ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම් වල ස්වභාවය**

ශ්‍රී ලංකාවේ පාරිභෝගිකයන්ට අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය තොග සහ සිල්ලර වශයෙන් සැපයීම , ලංකා සතොස වෙත ධාන්‍ය සැකසීම සඳහා මෝල් පහසුකම් සැපයීම සහ ලංකා සතොස ආයතනයට ප්‍රවාහන පහසුකම් සැපයීම මෙම ආයතනයේ ප්‍රධාන කාර්යයන්වේ.

**සේවක සංඛ්‍යාව**

වර්ෂය අවසාන වන විට සේවක සංඛ්‍යාව 295 කි. (2010/247)

**විශේෂ ගිණුම් ප්‍රතිපත්ති වල සාරාංශය**

**පොදු ප්‍රතිපත්ති**

**ගිණුම් සකස් කිරීමේ පදනම**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ප්‍රමිතියට අනුව සමූපකාර තොග වෙළඳ සංස්ථාවේ ශේෂ පත්‍රය, ආදායම් ප්‍රකාශනය, ව්‍යාපාර කොටස් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය , සහ ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන් (මූල්‍ය ප්‍රකාශන) සකස් කරන ලදී. ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගණකාධිකාරී ප්‍රමිතියට අනුකූලවේ. ආයතනයේ මූල්‍ය ප්‍රකාශනය සකස් කර ඇත්තේ නිශ්චිත වත්කම්, යන්ත්‍රෝපකරණ සහ උපකරණ ප්‍රතිප්‍රමාණ කිරීම හැරුණුකොට ඓතිහාසික පිරිවැය සම්මතය අනුවයි. . යතෝක්ථ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබෙන්නේ ශ්‍රී ලංකා රුපියල් වලිනි .

## සමූපකාර තොග වෙළඳ සංස්ථාව

## 2011 .12.31 දිනෙන් අවසන් වන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

**සංසන්දනාත්මක තොරතුරු**

ආයතනය විසින් උචිත පරිදි ගිණුම් ප්‍රතිපත්ති භාවිත කර ඇති අතර ඒවා පූර්ව වර්ෂයේදී යොදාගන්නා ලද ගිණුම් ප්‍රතිපත්තිවලට අනුකූලවේ. මෙම වර්ෂයේ ඉදිරිපත් කිරීමට යෝග්‍ය වන පරිදි අවශ්‍ය අවස්ථාවන් හිදී පසුගිය වසරේ සංඛ්‍යා සහ වාක්‍ය ඛණ්ඩ නැවත සකස් කරමින් වෙනස් කර තිබේ .

**වත්කම් සහ ඒවා තක්සේරු කිරීමේ පදනම**

**දේපල , යන්ත්‍රෝපකරන සහ උපකරණ**

දේපල , යන්ත්‍රෝපකරණ සහ උපකරණ අඩු සමුච්චිත ක්ෂයවීම් සහ ඕනෑම සම්මුචිත හානිකර අලාභ සඳහා වන පිරිවැය / සාධාරණ අගය අනුව ගණනය කර තිබේ .

වත්කම් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් ඍජුවම අදාළවන වියදම් වත්කම් යන්ත්‍රෝපකරණ සහ උපකරණ වල පිරිවැයට ඇතුළත් වේ. දේපල, යන්ත්‍රෝපකරණ සහ උපකරණ විවිධ ප්‍රයෝජනවත් ජීවයන් සහිත සංරචකයන්ගෙන් සමන්විත වූ විට ඒවා වෙනම දේපල, යන්ත්‍රෝපකරණ සහ උපකරණ අයිතමයන් වශයෙන් සලකනු ලැබේ. ධාරණ අගය (පොතේ අගය) පියවාගත නොහැකි අවස්ථාවන්හි දී දේපල, යන්ත්‍රෝපකරණ සහ උපකරණ වල හානි සඳහා ඒවායේ ධාරණ අගය (පොතේ අගය) සමාලෝචනය කරනු ලැබේ. වත්කමක ධාරණ අගය (පොතේ අගය) එහි ඇස්තමේන්තු ගත පියවා ගත හැකි මුදලට වඩා වැඩිනම් වත්කමෙහි ධාරණ අගය (පොතේ අගය) පියවාගත හැකි මුදලට ගැළපෙන පරිදි වහාම සඳහන් කරගනු ලැබේ. දේපල යන්ත්‍රෝපකරණ සහ උපකරණ පසුව නැවත තක්සේරු කරන්නේනම් ධාරණ අගයෙහි (පොතේ අගය) සිදුවන වැඩිවීම් කොටස්කරුවන්ගේ ව්‍යාපාර කොටස්වල සංචිතයට බැරකරනු ලැබේ. එම වත්කමෙහිම පූර්ව වැඩිවීම් පසුව අඩුවන්නේනම් ඒම කුමන හෝ වැඩිවීම් ප්‍රත්‍ප්‍රමාණ බැර සංචිතයට ප්‍රතිවිරුද්ධව ඍජුවම ව්‍යාපාර කොටස් වෙත අය කරගනු ලබන අතර එම වත්කමෙහිම පූර්ව වැඩිවීම් වලට හිලව් වන අඩුවීම් ලබන අතර කුමන හෝ වැඩි වීමක් හෝ වෙනත් සියළු අඩුවීම් අදායම් ප්‍රකාශනයට අයකරනු ලැබේ . අනෙකුත් සියලුම අඩුවීම් ආදායම් ප්‍රකාශනයට ඇතුළත් කරනු ලැබේ. දේපල යන්ත්‍රෝපකරණ සහ උපකරණ ප්‍රතිප්‍රමාණය වෘත්තීය වශයෙන් සුදුසුකම් ලත් ස්වාධීන තක්සේරුකරුවන් විසින් සිදු කරනු ලැබේ.

**පසු පිරිවැය**

යම් අයිතමයක් ආශ්‍රිත ආර්ථිකමය ප්‍රතිලාභ අනාගතයේ දී ආයතනයට ගලා ඒමේ හැකියාවක් පවතී නම් සහ එහි පිරිවැය විශ්වාස කළහැකි පරිදි ගණනය කළහැකි නම් පමණක් උචිත පරිදි වත්කමෙහි ධාරණ අගයට (පොතේ අගය) පසු පිරිවැය එකතු කිරීම හෝ වෙනම වත්කමක් වශයෙන් පිළිගැනීම සිදු කරනු ලැබේ. දේපල යන්ත්‍රෝපකරණ සහ උපකරණ ප්‍රතිස්ථාපනයේදී, බැහැර කිරීමේ දී හා අනාගත භාවිතයේ දී ප්‍රතිලාභ අපේක්ෂා නොකරන්නේ නම් නොසළකා හරිනු ලැබේ. දේපල යන්ත්‍රෝපකරණ සහ උපකරණ නොසළකා හැරීම තුළින් කිසියම් ලාභයක් හෝ අලාභයක් සිදු වන්නේ නම් එය නොසළකා හරින ලද වර්ෂයෙහි මූල්‍ය ප්‍රකාශනයට ඒ පිළිබඳව ඇතුළත් කරනු ලැබේ. වෙනත් සියලුම අලුත්වැඩියා සහ නඩත්තු කටයුතු සඳහා වන වැය ඒවා සිදුකළ මූල්‍ය කාලසීමාව තුළ දී මූල්‍ය ප්‍රකාශනය සඳහා ඇතුළත් කරනු ලැබේ.

සමූපකාර තොග වෙළඳ සංස්ථාව

## 2011 .12.31 දිනෙන් අවසන් වන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

**ක්ෂයවීම**

ඉඩමක් හැරුණු කොට දේපල, යන්ත්‍රෝපකරණ සහ උපකරණ වල සෑම කොටසකම ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවයන් පදනම් කරගෙන ක්ෂයවීම් ගණනය කරනු ලැබේ. බදු දෙන ලද වත්කම් අනුළුව අනෙකුත් සියළුම දේපල, යන්ත්‍රෝපකරණ සහ උපකරණ වල වටිනාකම හෝ ඒවායේ තක්සේරු කරන ලද ප්‍රයෝජනවත් ජීවයන් හි අවශේෂ වටිනාකම් ප්‍රතිප්‍රමාණය කරන ලද මිලගණන් සෘජු රේඛීය ක්‍රමය උපයෝගී කරගෙන ක්ෂය ගණනය කරනු ලැබේ.

ඒවායේ අගයන් පහත සඳහන් පරිදි දැක්විය හැකිය.

| | |
|---|---|
| ගොඩනැගිලි | 5% |
| යන්ත්‍රෝපකරණ සහ යන්ත්‍ර සූත්‍ර | 10% |
| මෝටර් වාහන | 20% |
| ලී බඩු සහ සවිකිරීම් | 33 1/3 % |
| කාර්යාල උපකරණ | 10% |
| පරිගණක සහ උපාංග | 33 1/3 % |
| ගබඩා උපකරණ | 10% |
| වෙනත් උපකරණ | 10% |
| ආම්පන්න | 10% |

**ආයෝජන**

දීර්ඝ කාලීන පදනම මත පැවතුණු සඳහන් නොකරන ලද ආයෝජන ජංගම නොවන ආයෝජන වශයෙන් වර්ගීකරණය කරනු ලබන අතර පිරිවැය ප්‍රකාශ කරනු ලැබේ. ක්ෂයවීම් තාවකාලිකව පැවතීම හැරුණු කොට ආයෝජන අගයන් ක්ෂය වීම අරමුණු කර ගනිමින් විධිවිධාන සලසා තිබේ.

**භාණ්ඩ තොගය**

යල් පැන ගිය සහ සංචරනශීලී අයිතම සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමෙන් පසු භාණ්ඩ තොගය අඩුම මිලට සහ උපලබ්ධි අගය ට තක්සේරු කරනු ලැබේ. සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදී තක්සේරුගත විකුණුම් මිල සහ ඊට අඩුවෙන් තක්සේරු කරන ලද උපලබ්ධි අගය සහ / හෝ ඒවා පවතින තත්ත්වයෙන් විකිණිය හැකි තත්වයට පරිවර්තනය කිරීමේ පිරිවැය ශුද්ධ උපලබ්ධි අගය වේ. ගැනුම් මිල , පරිවර්තිත පිරිවැය සහ අනෙකුත් පිරිවැය භාණ්ඩ තොගයේ වටිනාකමට ඇතුළත් වේ.

**ලැබීම්**

හානි සඳහා අඩු ප්‍රතිපාදන උපලබ්ධි වන සේ ඇස්තමේන්තු ගත කර ඇති අගයන් මත වෙළඳ ලැබීම් සළකා බලනු ලැබේ. ආයතනයට අයවිය යුතු සම්පූර්ණ මුදල සම්පූර්ණයෙන්ම රැස්කර ගැනීමට නොහැකි බව පැහැදිලිව ප්‍රත්‍යක්ෂ වන විට වෙළඳ ලැබීම්වල හානි සඳහා ප්‍රතිපාදන වෙන්කරනු ලැබේ. වත්කමෙහි ධාරණ අගය සහ ඇස්තමේන්තුගත උපලබ්ධි අගය අතර වෙනස ප්‍රතිපාදන මුදල වේ. විකුණුම් සහ බෙදාහැරීමේ වියදම් මත ආදායම් ප්‍රකාශනයෙහි ප්‍රතිපාදන මුදල සලකා බලනු ලැබේ. වෙළඳ ලැබීම් රැස්කරගත නොහැකි අවස්ථාවකදී එය වෙළඳ ලැබීම් වෙනුවෙන් ප්‍රතිපාදන ගිණුමෙන් කපාහරිනු ලැබේ.කළින් කපා හරින ලද පසුව අයකරගනු ලබන මුදල් ආදායම් ප්‍රකාශනයට බැර කරනු ලැබේ.

සමූපකාර තොග වෙළඳ සංස්ථාව

## 2011 .12.31 දිනෙන් අවසන් වන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

**මුදල් හා මුදල් සමාන දෑ**

මුදල් සහ මුදල් සමාන දෑ අතැති මුදල් ,බැංකු මුදල් සහ මුදල් බවට පත් කළ හැකි සහ අගයෙහි වෙනස්වීමට අවධානමේ අවධානමට අල්ප වශයෙන් බඳුන්වන කෙටිකාලීන ඉහළ ද්‍රවශීලතාවයකින් යුතු ආයෝජන වලින් සමන්විත වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි කාර්යය සඳහා මුදල් හා මුදල් සමාන දෑ අතැති මුදල් සහ බැංකු අයිරාවෙහි පවතින ශුද්ධ හිඟ මුදල් වලින් සමන්විත වේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි කාර්යය සඳහා ගෙවන ලද පොළී මෙහෙයුම් මුදල් ප්‍රවාහ වශයෙන් ද පොළිය සහ ලැබූ ලාභාංශ ආයෝජන මුදල් ප්‍රවාහ වශයෙන්ද ගෙවන ලද ලාභාංශ මූල්‍යමය මුදල් ප්‍රවාහ වශයෙන්ද වර්ගීකරණය කරනු ලැබේ . මෙහිදී වක්‍ර ක්‍රමය භාවිතාකර මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කරනු ලැබේ.

**සේවක ප්‍රතිලාභ**

**නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම - විශ්‍රාම පාරිතෝෂිතය**

ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන් හි අංක 16 අනුව සේවකයා විශ්‍රාම ලබා වසරක් සම්පූර්ණ වීමේ දී සම්පූර්ණ ගෙවීම සිදුකරන ලැබේ. සෑම වර්ෂයකම සේවය සඳහා මාසික වැටුපෙන් අඩක් (1/2) විශ්‍රාමික ප්‍රතිලාභ ගෙවීම් වශයෙන් ගෙවනු ලැබේ.

කෙසේ නමුත් 1983 අංක 12 දරන පාරිතෝෂිත ගෙවීම් පනතට අනුව සේවකයෙකු සඳහා පාරිතෝෂිතය සම්බන්ධ වගකීම ඇතිවන්නේ වසර 5ක අඛණ්ඩ සේවයක් සම්පූර්ණ කර ඇත්නම් පමණි .

වගකීම පිටතින් අරමුදල් සපයා ගැනීම හෝ ආයු ගණනය කිරීම මඟින් සපයාගැනීම සිදුකරනු නොලැබේ. මෙය ශේෂ පත්‍රයේ දී ජංගම නොවන වගකීම් වශයෙන් වර්ග කරනු ලැබේ.

**නිශ්චිත දායකත්ව සැලැස්ම - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල**

නිශ්චිත දායකත්ව සැලැස්මක් යනු ව්‍යාපාර කොටස් විසින් වෙනත් ආයතනයක් වෙත ස්ථාවර දායකත්ව මුදලක් ගෙවනු ලබන පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලැස්මක් වන අතර තව දුරටත් මුදල් ගෙවීම සඳහා නෛතික හෝ සම්ප්‍රයුක්ත බැඳීමක් නොමැත.

සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට සුදුසුකම් ලබන සියළුම සේවකයින් අදාළ ප්‍රඥප්තිය ප්‍රකාරව අදාල දායකත්ව අරමුදල් මඟින් ආවරණය කරනු ලැබේ. ආදායම් ප්‍රකාශනයෙහි සේවකයින් විසින් නිශ්චිත දායකත්ව සැලසුම් සඳහා සපයන ලද දායකත්වය වියදමක් වශයෙන් සලකනු ලැබේ.

**කල්බදු**

**මූල්‍ය කල්බදු**

වත්කම් ගිවිසුමක් මඟින් ලබා දීමේ දී මූල්‍ය කල්බදු මඟින් ලබා ගත් ලෙස වර්ගීකරණය කරනු ලබන අතර අදාළ ආයතනයට වත්කමෙහි අයිතියට අනුශංගික වූ අවදානම සහ දීමනා ලබන ආයතනය වශයෙන් මෙම වත්කම් වර්ග කළ හැකිය. මූල්‍ය කල්බදු මඟින් ලබාගන්නා ලද වත්කම් ඒවායේ සාධාරණ අගයට වඩා අඩු අගයකට ගණනය කරනු ලබන අතර ආරම්භයේ දී අඩු සමුච්චිත ක්ෂයවීමට සහ සමුච්චිත හානි අලාභයකට අනුව වර්තමාන අගය මත අවම බදු ගෙවීම් සිදුකරනු ලබයි.

සමූපකාර තොග වෙළඳ සංස්ථාව

2011 .12.31 දිනෙන් අවසන් වන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

**මෙහෙයුම් කල්බදු**

බදුහිමියා විසින් බදු ගිවිසුම යටතේ වත්කමක සියලුම අවදානම් සහ ප්‍රතිලාභ තමන් වෙත සක්‍රීය වශයෙන් රඳවාගන්නා අවස්ථාවන් හිදී එබඳු කල්බදු මෙහෙයුම් කල්බදු වශයෙන් වර්ගීකරණය කරනු ලැබේ. මෙහෙයුම් කල්බදු යටතේ වන ගෙවීම් බදු කාලසීමාව තුළදී ඍජු පදනමක් මත වියදමක් වශයෙන් ආදායම් ප්‍රකාශනයෙහි සළකනු ලැබේ.

**ප්‍රතිපාදන, ආපතික වත්කම් සහ ආපතික වගකීම්**

පූර්ව සිද්ධින්හි ප්‍රතිඵලයක් වශයෙන් ආයතනයක් සතුව නෛතික හෝ සම්ප්‍රයුක්ත බැඳීම් පවතින විට ප්‍රතිපාදන සළකනු ලබන අතර එබඳු වගකීමක් ඉටු කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් ගලා යාම සිදුවිය හැකි අතර එබඳු වගකීමක් සඳහා විශ්වාස කටයුතු මූල්‍ය ඇස්තමේන්තුවක් සකස් කල හැකිය.

සම්පත් ගලා යාම විදුර වුවද සියලුම ආපතික වගකීම් මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් වශයෙන් දක්වනු කරනු ලැබේ.

**වගකීම්**

ශේෂ පත්‍රයෙහි සඳහන් දිනට දක්වා ඇති සියලුම ද්‍රව්‍යමය වගකීම් මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන් මඟින් දක්වා තිබේ.

**වත්කම් වලට සිදුවන හානි**

අවිනිශ්චිත ප්‍රයෝජනවත් ජීවයක් සහිත ඉඩමක් වැනි වත්කම් ක්‍රමක්ෂට ලක් නොවන අතර වාර්ෂිකව හානි සඳහා ක්‍රමක්ෂය කරනු ලැබේ. ක්‍රමක්ෂයට ලක්වන වත්කම් වාර්ෂිකව හෝ ධාරණ අගය පියවා ගත නොහැකියැයි සිද්ධි හෝ වෙනස්වීම් මඟින් දක්වන අවස්ථාවන්හි දී ඊට පෙර දිනයක හානි සඳහා සමාලෝචනය කරනු ලැබේ. වත්කමක ධාරණ අගය එහි අයකරගත හැකි අගය ඉක්මවන්නේ නම් මූල්‍ය ප්‍රකාශනයෙහි හානි අලාභයක් වශයෙන් දක්වනු ලැබේ. වත්කමක සාධාරණ අගයට වඩා වැඩි එහි විකුණුම් මිලට සහ එහි භාවිත අගයට වඩා අඩු අගය අයකරගන්නා මුදල වේ.

**බදු අයකිරීම**

**ආදායම් බදු**

මූල්‍ය ප්‍රකාශනයන්හි ආදායම් සහ වියදම් මත ආදායම් බදු සඳහා වන ප්‍රතිපාදන පදනම් වන අතර ආදායම් බදු පනතෙහි විධිවිධාන අනුව එය ගණනය කරනු ලැබේ.

බදු ගෙවනු ලබන සැපයුම් සඳහා එකතු කරන ලද අගය මත බද්ද

2002 අංක 14 දරන අගය එකතු කරන ලද බදු පනතෙහි විධිවිධාන සහ එහි සංශෝධනයන්ට අනුව බදු ගෙවනු ලබන සැපයුම් සඳහා එකතු කරන ලද අගය මත බද්ද ගෙවනු ලැබේ .

10

සමූපකාර තොග වෙළඳ සංස්ථාව

## 2011 .12.31 දිනෙන් අවසන් වන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

**කොටස් තොරතුරු**

තොග සහ සිල්ලර සේවා ( උදා:- වී කෙටීම ,ප්‍රවාහනය) ආයතනයේ මූලික කොටස් වේ. ආයතනය සඳහා භූ ගෝලීය කොටසක් ලෙස හඳුනාගත හැකි විශේෂ සංරචක නොමැත ආයතනයෙහි කළමණාකරනය සහ අභ්‍යන්තර වාර්තාකරණ ව්‍යුහය අනුව වෙළඳ කොටස් පදනම් වේ.

අන්තර් කොටස් මිල අංශ විසින් අන්‍යෝන්‍ය වශයෙන් එකඟතාව පලකරනු ලබන මිල අනුව තීරණය කරනු ලැබේ.

කොටසකට සෘජුවම සම්බන්ධ වන සහ සාධාරණ පදනමක් මත දැක්විය හැකි අයිතමයන්ට කොටස් ප්‍රතිඵල , වත්කම් සහ වගකීම් ඇතුළත් වේ. ආදායම් උපයන වත්කම් සහ ආදායම් , පොළී සහිත ණය, ණයට ගැනුම් සහ වියදම් සහ සංයුක්ත වත්කම් සහ වියදම් ප්‍රධාන වශයෙන් වෙන් නොකරන ලද අයිතමයන් යටතට ගැනේ.

කොටස් ප්‍රාග්ධන වියදම යනු එක් ගිණුම් කාල සීමාවකට වඩා වැඩිපුර භාවිත කිරීමේ අපේක්ෂාවෙන් කොටස් වත්කම් අත්කර ගැනීමේදී අදාල කාලය තුළ වැයවන සමස්ත පිරිවැය කොටස් ප්‍රාග්ධන වියදම වේ.

**ශේෂ පත්‍රයෙහි දිනයට පසුව සිදුවන සිදුවීම්**

ශේෂ පත්‍රයෙහි දිනයට පසුව සලකාබලනු ලබන , දක්වන සහ අදාළ අවස්ථාවන් හීදී ගැලපුම් කරන ලබන සියලුම ද්‍රව්‍ය වේ.

**ශේෂ පත්‍රයෙහි සඳහන් දින සිට ක්‍රියාත්මක නොවන අලුතින් නිකුත් කරන ලද ගිණුම් ප්‍රමිතීන්**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය SLFRS(IFRS ට සමාන) සහ LKAS (IAS ට සමාන) සමඟ සම්බන්ධව නිකුත් කරන ලද ශ්‍රී ලංකා නව ගිණුම් ප්‍රමිතීන් ආයතනය විසින් 2012 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි යොදාගන්නා ලදී. වර්තමානයේදී ස්වකීය මූල්‍ය ප්‍රකාශනයන් සඳහා එම ප්‍රමිතීන් යොදා ගැනීමෙන් ලැබෙන ප්‍රතිඵල පිළිබඳව ඇගයීම් ක්‍රියාවලියක ආයතනය නිරතව සිටියි. එහි ප්‍රතිඵල වාර්තා කරනු ලබන දිනය වන විට ලැබී නොතිබිණි .

**ආදායම් ප්‍රකාශනය**

ශ්‍රී ලංකා ගණකාධිකරන ප්‍රමිතීන් විසින් දක්වන ලද ආයතනයෙහි කාර්ය සාධනය සම්බන්ධ මූලිකාංග ඵලදායී අන්දමින් භාවිතා කරමින් වියදම්වල ක්‍රියාකාරීත්වය මත ආදායම් ප්‍රකාශනය ඉදිරිපත්කරන ලදී.

**ආදායම්**

ආයතනයේ ආදායම පාරිභෝගිකයන් වෙත භාණ්ඩ සැපයීමේ බිල් පතෙහි අගය අනුව වේ.

සමූපකාර තොග වෙළඳ සංස්ථාව

## 2011 .12.31 දිනෙන් අවසන් වන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

**ආදායම් සලකා බැලීම**

ආයතනයට ගලාඑන ආර්ථික ප්‍රතිලාභ අනුව ආදායම සලකා බැලෙන අතර ආදායම විශ්වාස කළ හැකි අයුරින් ගණනය කළ හැකිය. ලැබීම් වලින් ලද සාධාරණ අගය , ශුද්ධ වෙළඳ වට්ටම් සහ අගය එකතුකරන ලද බදු සහ ආයතනය තුළ ශුද්ධ විකුණුම් සලකා බැලීමෙන් සාධාරණ අගයකට ආදායම ගණනය කරනු ලැබේ.

පහත දැක්වෙන සුවිශේෂී නිර්ණායක ආදායම් හඳුනාගැනීම සඳහා යොදා ගැනේ.

මිලදී ගනු ලබන තැනැත්තා වෙත විශේෂ අවදානමක් සහ අයිතිය මත ප්‍රතිලාභ පැවරූ විට සලකා බැලීම පියවා ගතහැකි විට විශ්වාස කටයුතු අන්දමින් ආශ්‍රිත මිළ ගණන් සහ ආපසු එවනු ලැබිය හැකි භාණ්ඩ ඇස්තමේන්තු ගත කළ හැකි විට සහ භාණ්ඩ සමඟ අඛණ්ඩ කළමනාකරණ මැදිහත් වීමක් නොමැති විට භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම හඳුනාගත හැකිය.

බදු ආදායම හඳුනාගනු ලබන්නේ උපචිත පදනම මතයි.

බදු ආදායම හඳුනාගනු ලබන්නේ එය උපචිත වන ආකාරයටයි.

ආයතනයට ලාභාංශ ලැබීමේ අයිතිය ඇති විට උපචිත පදනම මත ලාභාංශ ආදායම ගණනය කෙරේ.

ආයෝජන ඇතුලුව දේපල යන්ත්‍රෝපකරණ සහ උපකරණ සහ වෙනත් ජංගම නොවන වත්කම් විකිණීමෙන් ලැබෙන ආදායම් ස්භාවයේ ලැබීම් හෝ අලාභ එබඳු වත්කම්වල ධාරණ අගය විකිණීමේදී අඩුකිරීමෙන් පසු ආදායම් ප්‍රකාශනයට ඇතුලත් කරනු ලැබේ.

අනෙකුත් සිලුම ආදායම් හඳුනාගනු ලබන්නේ උපචිත පදනම මතයි.

**දේපල යන්ත්‍රෝපකරණ සහ උපකරණ විකිණීම**

දේපල යන්ත්‍රෝපකරණ සහ උපකරණ විකිණීමෙන් ලැබෙන ලාභ හෝ අලාභ ආදායම් ප්‍රකාශනයට ඇත්ළත් කරනු ලැබේ .

**වියදම්**

විශේෂ ආදායම් අයිතම සඳහා දරන ලද පිරිවැය සහ ඉපැයීම අතර සෘජු සම්බන්ධතාවයේ පදනම මත ආදායම් ප්‍රකාශනයේ වියදම් හඳුනාගැනේ . කාර්යක්ෂම අයුරින් ව්‍යාපාරයක් කිරීමේදී සහ දේපල යන්ත්‍රෝපකරණ සහ උපකරණ නඩත්තු කිරීමේදී වැයවන වියදම් ආදායම් ප්‍රකාශනයට ඇතුළත් කරනු ලැබේ.

**රාජ්‍ය සුරැකුම්පත්**

කොමර්ෂල් බැංකුවේ ණය 6ක් පියවීම මගින් ආයතනය වෙනුවෙන් මාහා භාණ්ඩාගාරය විසින් බැඳුම්කර නිකුත්කර තිබේ. දීර්ඝ කාලීනවගකීම් යටතේ ආයතනයෙහි ශේෂ පත්‍රයෙහි බැඳුම්කරයේ වර්තමාන අගය දක්වා තිබේ . පසුගිය වර්ෂයේ අගය සහ ඊට සාපේක්ෂව බැඳුම්කරයේ මෙම වර්ෂයේ වටිනාකම අතර වෙනස ආදායම් ප්‍රකාශනයේ දක්වා තිබේ.

## 2011.12.31 දිනෙන් අවසන්වන වර්ෂයෙහි මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

**සියලුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා තිබේ**

**සටහන 2 - පිරිවැටුම**

| | | |
|---|---|---|
| වෙළඳ ආදායම | 313,800,611 | 185,605,726 |
| නියෝජිතයින් විසින් ඇසුරුම් පෙට්ටි විකිණීම | - | - |
| ඇසුරුම් පෙට්ටි විකුණුම් ආයතන | - | - |
| අඩුකලා : බදුකුලී පිරිවැටුම් | - | 2,784,086 |
| **එකතුව** | **313,800,611** | **182,821,640** |

ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන් 29 ට අනුව සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් ලැබුණු සහ ලැබිය යුතු අගයන් සාධාරන අගයකට ගණනය කරනු ලැබේ.

**සටහන : 03 විකුණුම් පිරිවැය**

| | | |
|---|---|---|
| අආරම්භක තොගය | 31,220,951 | 29,942,699 |
| එකතුකලා මිලදී ගැනීම් ( සටහන අංක 03.1 ) | 248,161,635 | 261,403,176 |
| සෘජු පිරිවැය ( සටහන අංක 03.2 ) | 25,675,503 | - |
| | 305,058,089 | 291,345,875 |
| අඩුකලා :ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ තොගය කපාහරින ලදී | 2,360,907 | - |
| අඩුකලා : අවසාන වෙළඳ තොගය | 41,635,183 | 110,518,117 |
| | **43,996,090** | |
| **එකතුව** | **261,061,999** | **180,827,758** |

ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන් 05 (ඉන්වෙන්ට්‍රිගත) අනුව , ඉන්වෙන්ට්‍රිගත වත්කම්

අ)සමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදී විකිණීම සඳහා තබාගන්නා ලදී

ආ)එබඳු විකුණුම් සඳහා නිෂ්පාදන ක්‍රියාවලිය හෝ

ඇ) නිෂ්පාදන ක්‍රයාවලියේදී හෝ සේවා සැපයීමේදී යොදාගනු ලබන අමුද්‍රව්‍ය හෝ සැපයුම් ද්‍රව්‍ය

ආයතනය විසින්එමනිසා විකුණුම් පිරිවැය සහ ප්‍රවාහන දෙපාර්තමේන්තු තොගය ගණනය කිරීමේ අරමුණින් වෙළඳ තොගය හඳුනාගෙන ඇති අතර 2011 වර්ෂයේදී ආරම්භක තොග ශේෂයෙන් ඇසුරුම් ද්‍රව්‍ය තොගය ඉවත්කර තිබේ.

| | |
|---|---|
| ප්‍රවාහන අංශයේ තොගය (අවසාන තොගය) | 2,360,907.00 |
| ගොඩනැඟිලි අංශයේ තොගය | 4,143,032.00 |
| ඇසුරුම් ද්‍රව්‍ය | 454,513.00 |
| | **6,958,452.00** |

2011 .12.31 දින වන විට භෞතික තොගයක් නොතිබුණු හෙයින් 2011 වර්ෂයේදී රු:.2,360,907 අගයැති ප්‍රවාහන අංශයට අදාළ තොගයක් ලාභ අලාභ ගිණුමට අය කරගන්නා ලද අතර 2011 වර්ෂයේ විකුණුම් පිරිවැය ගණනය කිරීමේදී රුපියල් 4143032 ක් වටිනා ගොඩනැඟිලි අංශ තොගය සහ රු..454,513 ඇසුරුම් ද්‍රව්‍ය තොගය නොසලකා හරින ලදී. රු 2,360,907 වටිනා ප්‍රවාහන අංශ තොගය 2011 වර්ෂයේදී ලාභ අලාභ සඳහා අයකර ගන්නා ලදී. පාරිභෝගිකයා වෙත සාධාරන මිලට අත්‍යඅවශය පාරිභෝගිකයා ද්‍රව්‍යය සැපයීමේ සහ දේශීය වෙළඳ පොළෙහි වෙළඳ පොළ මිලගණන් වල උච්චාවචනය තුලනය කරගැනීම සඳහා 2010 වර්ෂයේදී සමූපාකාර ව්‍යාපාරය ආරම්භ කරන ලදී. 2011 වර්ෂයේදී මෙහෙයුම් වලින් රුපියල් 36,097,856.26 ක දළ අලාභයක්ද ,රුපියල් 72,421,133.00 ක ශුද්ධ අළාභයක්ද සිදුවිය. මෙමෙ ගනුදෙනු (සමූපකාර මෙහෙයුම්වලට අදාළ ආරම්භක තොගය ,මිලදී ගැනුම් ,විකුණුම් සහ අවසාන තොගය ඇතුළුව )2011 වර්ෂයේ සතොස ආදායම් ප්‍රකාශනයේ ශුද්ධ ලාභ/අලාභ වශයෙන් ගණනය කිරීමෙන් ඉවත් කරන ලදී.2011 වර්ෂයේ මෙම මෙහෙයුම්වල අවසාන ප්‍රතිඵලය <u>සමූපකාර කොමසාරිස් වෙත ගෙවියයුතු ණය ගිණුමට</u> ගලපන ලදී.

**2011 වර්ෂයේ සමූපකාර ගිණුම් තොරතුරු**

| තොගය | ආරම්භක තොගය | මිලදී ගැනීම | අවසාන තොගය | ශුද්ධ ලාභය |
|---|---|---|---|---|
| කුරුණෑගල | 9,441,119 | 152,921,041 | 2,972,703 | 54,953,002 |
| අනුරාධපුරය | - | 45,091,392 | 515,507 | 11,017,373 |
| අරණායක | - | 44,801,297 | 2,596,556 | 33,709,257 |
| බදුල්ල | - | 16,849,791 | 1,843,895 | 25,386,113 |
| නුවර | | 73,690,286 | 4,876,996 | 72,760,235 |
| මාලිගාවත්ත | - | 89,394,349 | 139,244 | (24,152,246) |
| මාතර | 13,335,290 | 93,879,912 | 1,742,261 | 33,329,656 |
| මැක්ලම් | 51,923,213 | 429,883,602 | 9,646,992 | (353,933,052) |
| මොනරාගල | - | 72,532,431 | 762,040 | 49,235,370 |
| පොළොන්නරුව | - | 9,687,222 | 1,780,610 | 4,416,677 |
| රත්නපුරය | - | 62,278,696 | 1,740,447 | 48,809,563 |
| වව්නියාව | | 48,910,596 | 1,182,271 | 8,370,196 |
| එකතුව | 74,699,622 | 1,139,920,615 | 29,799,522 | (36,097,856) |

සමූපකාර තොග වෙළඳ සංස්ථාව

2011.12.31 දිනෙන් අවසන්වන වර්ෂයෙහි මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

**සියලුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා තිබේ**

**සටහන 05- පරිපාලන සහ ආයතනික වියදම්**

| | | |
|---|---|---|
| අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු සහ දීමනා | 1,021,308 | 648,275 |
| නවාතැන් සඳහා වියදම් | 21,081 | - |
| ගිවිසුම් අලුත් කිරීමේ ගාස්තු | 11,200 | - |
| සේවක වැටුප් සහ වේතන (පෞද්ගලික පිරිවැය) | 70,219,323 | 34,540,779 |
| කාර්යය මණ්ඩල දීමනා | 839,832 | - |
| පවිත්‍රතා වියදම් | 2,193,342 | - |
| ඩයලොග් ටීවී ගාස්තු | 11,691 | - |
| විගණන විමසුම් ගාස්තු | 15,375 | - |
| තැපැල් ගාස්තු | 34,835 | - |
| ආරක්ෂක සේවා සඳහා වියදම් | 2,384,729 | - |
| සේවා ගාස්තු | 8,062 | - |
| විනොද කටයුතු සඳහා පිරිවැය | 438,336 | - |
| කාර්යයමණ්ඩල ප්‍රසාද දීමනා | 214,000 | 111,500 |
| ආධාර | 201,435 | - |
| පාරිතෝෂිත | 4,437,033 | 2,390,707 |
| වරිපනම් සහ බදු | 5,987,062 | 2,216,599 |
| විගණන ගාස්තු | - | 800,000 |
| සේවක සුභ සාධනය | 1,076,236 | 731,264 |
| ක්ෂයවීම් | 28,505,697 | 9,788,111 |
| සේවක අර්ථසාධක අරමුදල | 4,964,102 | 2,439,960 |
| සේවක භාරකාර අරමුදල | 1,277,875 | 609,990 |
| P.A.Y.E | 13,662 | - |
| අතිකාල දීමනා ගෙවීම් | 5,130,535 | - |
| වෙළඳ ප්‍රචාරනය | 1,006,591 | 104,780 |
| සේවක වන්දි | - | 618,890 |
| රක්ෂණ | 577,754 | 252,550 |
| නීති ගාස්තු | 742,541 | 1,393,797 |
| වෘත්තීය ගාස්තු | 38,260 | 134,738 |
| ගමනාගමන සහ ප්‍රවාහන | 757,684 | 3,967,908 |
| අධිභාර | - | - |
| උපදේශන ගාස්තු | 30,000 | - |
| ගමනාගමන දීමනා | 167,702 | - |
| ප්‍රතිකාර දීමනා | 1,056,455 | - |
| විදුලිය | 16,897,246 | 6,226,896 |
| ජලය සඳහා වියදම් | 1,237,751 | - |
| දුරකථන සහ ෆැක්ස් | 1,155,427 | 472,331 |
| මුද්‍රණ සහ ලිපි ද්‍රව්‍ය | 2,106,798 | 200,645 |
| සාමාජික ගාස්තු | 33,500 | - |
| වාහන දීමනා | 1,059,925 | - |
| කාර්යයමණ්ඩල ඉන්ධන දීමනා | 1,526,685 | - |
| අළුත්වැඩියා සහ නඩත්තු | 545,286 | 8,330,387 |
| නිළ ඇඳුම් වියදම් | 50,975 | - |
| විවිධ වියදම් | 152,555 | - |
| වෛද්‍ය ගාස්තු | 5,500 | - |
| සේවා ගාස්තු | 25,000 | - |

**සියලුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා තිබේ**

| | | |
|---|---|---|
| ජාතිය ගොඩනැගීමේබදු වියදම් | 853,038 | - |
| එකතුකල අගය මත බදු වියදම් | 5,514,191 | - |
| Un Clambel Vat | 198,170 | - |
| දඩ | 3,933 | - |
| විවිධ වියදම් | 836,962 | 2,877,378 |
| එකතුව | 165,586,679 | 78,857,500 |

සමූපකාර තොග වෙළඳ සංස්ථාව

2011.12.31 දිනෙන් අවසන්වන වර්ෂයෙහි මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

සියලුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා තිබේ

**සටහන 06 - විකුණුම් සහ මුදා හැරීම්**

| | | |
|---|---|---|
| විකුණුම් කාර්යයමණ්ඩල වැටුප් සහ වේතන | 2,019,715 | 34,540,779 |
| සේවක අර්ථසාධක අරමුදල | - | 2,439,960 |
| සේවක භාරකාර අරමුදල | - | 609,990 |
| සේවක ප්‍රසාද දීමනා | - | 111,500 |
| ඇසුරුම් ගාස්තු | 40,375 | - |
| ප්‍රවාහන වියදම් | 6,096,040 | - |
| ඉන්ධන ප්‍රවාහන අංශය | 7,769,433 | - |
| පාරිතෝෂිකය | - | 2,390,707 |
| සේවක සුභ සාධනය | - | 731,264 |
| ගමනාගමන සහ යැපීම් | - | 3,980,408 |
| කල්බදු , වරිපනම් සහ බදු | 498,732 | 3,454,099 |
| තැපැල් සහ දුරකථන | - | 472,331 |
| විවිධ වියදම් | - | 2,877,377 |
| අගය අඩුකල තොගයේ ලාභ/අලාභය | - | 28,418 |
| විදුලිය | - | 6,226,896 |
| වෙළඳ ප්‍රචාරනය සහ විකුණුම් ප්‍රවර්ධනය | - | 104,780 |
| මුද්‍රණය සහ ලිපි ද්‍රව්‍යය | - | 200,645 |
| ක්ෂයවීම් | - | 9,788,111 |
| පරිශ්‍රය අළුත්වැඩියා කිරීම සහ නඩත්තු | 18,957,238 | - |
| ප්‍රවාහන අංශය අළුත්වැඩියා කිරීම සහ නඩත්තු | 2,002,756 | 8,330,387 |
| සැකසහිත ණය සඳහා ප්‍රතිපාදන | - | 8,630,612 |
| වෘත්තීය ගාස්තු | - | 134,738 |
| පාලම් තරාදි ගාස්තු | 2,500 | - |
| රක්ෂණය | - | 252,550 |
| වට්ටම් | 28,931 | - |
| බලපත්‍ර ගාස්තු | 432,303 | 537,582 |
| සේවක වන්දි | 219,590 | 618,890 |
| **එකතුව** | **38,067,612** | **86,462,024** |

**සටහන 07 - මූල්‍ය පිරිවැය**

| | | |
|---|---|---|
| හර බදු | 70,078 | - |
| බැංකු ගාස්තු | 714,767 | - |
| කල්බදු පොළිය | 583,566 | - |
| අනෙකුත් කල්බදු වියදම් | 142,584 | - |
| මහජන බැංකු ණය සඳහා පොළිය | 21,000,000 | 21,000,000 |
| **එකතුව** | **22,510,995** | **21,000,000** |
| | | |
| බැඳුම්කර පොළී ගාස්තු | **323,812,668** | **323,812,668** |

**සටහන 8 :**

| | | |
|---|---|---|
| සමූපකාර තොග වෙළඳ සංස්ථාවේ 2003.12.31 දිනට ජංගම ගිණුම් ශේෂය සතොස | - | 381,412,591 |
| සිල්ලර සමාගම සංස්ථාගත වීමෙන් පසු මිලදී ගැනුම් ගිවිසුමෙහි 6.2 (ඇ) පායය අනුව ප්‍රතිව්‍යුහලතකිරීම් ගනුදෙනුවක් වශායන් | | |
| ෘකපා හරින ලදී | | |
| **එකතුව** | - | **381,412,591** |

**සමූපාකාර තොග වෙළඳ සංස්ථාව**

**( මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්)**

**(සියලු සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා තිබේ.)**

**සටහන 09 -දේපල යන්ත්‍රෝපකරණ සහ උපකරණ**

| විස්තරය | පිරිවැය | | | | ක්ෂයවීම | | | | WDV |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | වර්ෂය තුළ | | | | වර්ෂය සඳහා | | | |
| | 2011.01.01 දිනට | එකතුකලා | අලෙවිය | 2011.12.31 දිනට | 2011.01.01 දිනට | ගෙවීම් | අලෙවිය | 2011.12.31 දිනට | 2011.12.31 දිනට |
| අයබදු වලින් නිදහස් ඉඩම් | 955,510,235 | - | - | 955,510,235 | - | - | - | - | 955,510,235 |
| අයබදුවලින් නිදහස් ඉඩම් | 2,311,930 | - | - | 2,311,930 | - | - | - | - | 2,311,930 |
| අයබදුවලින් නිදහස් ඉඩම්වල ගොඩනැඟිලි | 220,090,417 | 13,666,639 | - | 233,757,056 | 141,147,694 | 10,989,657 | - | 152,137,351 | 81,619,705 |
| අයබදුවලින් නිදහස් ඉඩම්වල ගොඩනැඟිලි | 2,288,203 | - | - | 2,288,203 | 2,158,667 | 48,335 | - | 2,207,002 | 81,201 |
| රජයේ ඉඩම්වල ගොඩනැඟිලි | 82,252,459 | 8,016 | - | 82,260,475 | 49,615,711 | 3,200,400 | - | 52,816,111 | 29,444,364 |
| වොක්ෂ්වෝල් ගරාජය | 16,460,291 | - | - | 16,460,291 | 10,919,699 | 823,015 | - | 11,742,714 | 4,717,577 |
| යන්ත්‍රෝපකරණ සහ යන්ත්‍ර සූත්‍ර | 88,163,606 | 127,000 | - | 88,290,606 | 87,928,645 | 215,712 | - | 88,144,357 | 146,249 |
| මෝටර් වාහන | 39,475,999 | 22,588,950 | 12,082,000 | 49,982,949 | 7,474,800 | 7,895,200 | 3,181,400 | 12,188,600 | 37,794,349 |
| ලී බඩු සහ කාර්යාලීය උපකරණ | 47,778,931 | 13,190,312 | - | 60,969,243 | 46,469,112 | 4,201,628 | - | 50,670,740 | 10,298,503 |
| පරිගණක උපාංග | 76,270,112 | 2,104,512 | - | 78,374,624 | 75,574,944 | 726,857 | - | 76,301,801 | 2,072,823 |
| ගබඩා උපකරණ | 49,955,807 | 196,750 | - | 50,152,557 | 49,588,546 | 19,675 | - | 49,608,221 | 544,336 |
| මෙවලම් සහ උපකරණ | 45,494,529 | 8,273,546 | - | 53,768,075 | 44,657,321 | 385,218 | - | 45,042,539 | 8,725,536 |
| එකතුව | 1,626,052,519 | 60,155,726 | 12,082,000 | 1,674,126,245 | 515,535,139 | 28,505,697 | 3,181,400 | 540,859,436 | 1,133,266,809 |

සමූපකාර තොග වෙළඳ සංස්ථාව

(ආ) ශ්‍රී.ලං.ගි.ප්‍ර. 18 — මුළුමණින්ම ක්ෂය කර අවසන් වූ නමුත් තවදුරටත් ප්‍රයෝජනයට ගතහැකි පිරිවැය රු. 245,802,705 ක්වූ දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී.ලං.ගි.ප්‍ර. 26 — සීඩබලිව්ඊ ඉකොනොමික් සෙන්ටර් සර්විස් පුද්ගලික සමාගමේ කොටස් අයිතියෙන් සියයට සියයක්ම සමූපකාර තොග වෙළඳ සංස්ථාව සතු වුවද එම සමාගමේ මූල්‍ය ප්‍රකාශන ද ඒකාබද්ධ කර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

(ඈ) ශ්‍රී.ලං.ගි.ප්‍ර. 40 — ආදායම් ඉපයීමට අදාළ ගොඩනැගිලි වල වටිනාකම ආයෝජන දේපල යටතේ ශේෂ පත්‍රය තුළ වෙනම ම දක්වා නොතිබුණි.

### 2.2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

දේපල පිරියත හා උපකරණ වල ප්‍රයෝජනවත් ආයුකාලය පදනම් කර ක්ෂය ගණනය කරන බව මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇතත් වර්ෂය තුළ මිලදීගත් හා ඉවත්කල වත්කම් ක්ෂය නොකිරීමේ ප්‍රතිපත්තිය සංස්ථාව අනුගමනය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ මිළදීගත් රු. 41,917,270 ක් වූ වත්කම් හා අපහරණය කළ රු. 18,930,309 ක් වූ වත්කම් සම්බන්ධයෙන් ක්ෂය ගණනය කර නොතිබුණි .

## 2.2.4 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පහත දැක්වෙන හේතූන් මත විගණනය සඳහා ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් දත්ත හා තොරතුරු වල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.

(i). ගෙවීම් වවුචර් ක්‍රමවත් ආකාරයට මුදල් පොතේ සටහන් කර නොතිබීම හේතුවෙන් සියළුම ගෙවීම් මුදල් පොතේ ඇතුළත්වී තිබේද යන්න තහවුරු කරගත නොහැකි විය.

(ii). ලදුපත් ක්‍රමානුකූල ආකාරයට මුදල් පොතේ සටහන් කර නොතිබීම හේතුවෙන් සියළුම ලැබීම් මුදල් පොතේ ඇතුළත් වී තිබේද යන්න තහවුරු කර ගත නොහැකි විය.

(iii). ඉකුත් වර්ෂ අවසානයේ ශේෂ පෙන්නුම් නොකළ අත්තිකාරම් ගෙවීම් හා අනෙකුත් ලැබිය යුතු ශේෂ පිළිවෙලින් රු.8,867,265 ක් හා රු.18,145,017 ක් සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂ ලෙස දක්වා තිබුණි.

(iv). විගණනය වෙත මුලින් ඉදිරිපත් කර තිබුණු 2011 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ හා පසුව ඉදිරිපත් කළ නව සංශෝධිත මූල්‍ය ප්‍රකාශනයේ චක්‍රීය අරමුදලේ විකුණුම් හා අවසාන තොගය අතර රු. මිලියන 28 ක් ද, චක්‍රීය අරමුදලේ ගැණුම් හා ආරම්භක තොගය අතර රු.මිලියන 64 ක් ද ලෙස එකතුව රු. මිලියන 92 ක සමස්ථ වෙනසක් තුළින් ලාභයේ ද රු. මිලියන 36 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනසට අදාල ජ්නල් සටහන් / ගැළපුම් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. ඒ අනුව චක්‍රීය අරමුදලේ ප්‍රතිඵලය හා ආදායම් හා වියදම් පිළිබඳව විස්තර නිවැරදි බවට සනාථ කළ නොහැකි විය.

(ආ) වෙළඳ ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා 2006 වර්ෂයේදී මහා භාණ්ඩාගාරය විසින් ලබාදුන් රු.මිලියන 275 ක ණය මුදල ආපසු ගෙවීමට කටයුතු කර නොතිබුණු අතර, එය ආපසු ගෙවිය යුතු ණය ලෙස දක්වනවා වෙනුවට ප්‍රතිව්‍යුහගත කිරීමේ සංචිතයට ඇතුළත් කර තිබුණි.

(ඇ) ලංකා සතොස සමාගමෙන් වාර්ෂික බදු කුලී හා රටබීම බලපත්‍ර ගාස්තු වශයෙන් ලැබිය යුතු රු. 71,561,640 ක් මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි.

(ඈ) වෙළඳ හා අනෙකුත් ණයගැති ශේෂ තුළ රු. 279,102,257 ක අසාමාන්‍ය බැර ශේෂද, ණයහිමි ශේෂ තුළ රු.38,825,045 ක අසාමාන්‍ය හර ශේෂද ඇතුළත් වී තිබුණි. මෙම අසාමාන්‍ය ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීම වෙනුවට එකිනෙක හිලව් කර ලැබිය යුතු ශුද්ධ මුදල වූ රු.240,277,212 ක් ලෙස දැක්වීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වලින් නිවැරදි තත්ත්වයක් නිරූපණය නොවුණි.

(ඉ) පිරිවැය රු.80,282,250 ක් වූ වත්කම් සඳහා සමාලෝචිත වර්ෂයට අදාලව රු.1,068,232 ක් ක්ෂය වෙනුවෙන් ප්‍රතිපාදන සිදුකර නොතිබුණු අතර, විගණන නියැදි පරීක්ෂණය අනුව පිරිවැය රු.16,911,000 ක් වූ ඉකුත් වර්ෂවල මිළදීගත් වාහන වෙනුවෙන්ද ප්‍රතිපාදන සිදුකර නොතිබුණි.

(ඊ) ගත් මිල රු.12,082,000 ක් වූ වාහන 21 ක් සංස්ථාව වර්ෂය තුළ විකුණා තිබු නමුත් වාහන විකුණුම් ලාභය ගණනය කිරීමේදී වාහන දෙකකට අදාල සමුච්චිත ක්ෂය පමණක් ගලපා තිබීම හේතුවෙන් විකිණීමේ අලාභය නිවැරදිව ගණනය කර නොතිබුණි.

(උ) ඉකුත් වර්ෂයේ ණයගැතියන් ලෙස පැවති රු. 346,110,167 ක් ශේෂ සමාලෝචිත වර්ෂය අවසාන වන විට තවදුරටත් ණයගැතියන් ලෙස පෙන්නුම් කරන බව ගිණුම්වලින් අනාවරණය නොවුවද එම ණයගැතියන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.200,823,844 ක් බොල්ණය ප්‍රතිපාදන සලසා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානයට වූ ශුද්ධ ණයගැති ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති රු. 2,360,907 ක් වූ ප්‍රවාහන අංශයට අයත් තොග භෞතිකව නොතිබූ බැවින් තොගයෙන් ඉවත් කර තිබුණද අලාභය ආදායම් ගිණුමෙන් කපාහැර නොතිබුණි. තවද මෙම තොග ඌනතාවය සම්බන්ධයෙන් කළමණාකාරීත්වය මෙතෙක් ක්‍රියාමාර්ගයක්ද ගෙන නොතිබුණි.

(එ) 2011 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු විගණන ගාස්තු රු. 9,619,007 වෙනුවෙන් ප්‍රතිපාදන සිදුකර නොතිබුණි.

(ඒ) සමූපකාර වත්‍රිය අරමුදලේ ගණුදෙනු සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබු අතර එහි ඉතුරුම ගිණුමෙන් සමාලෝචිත වර්ෂය තුළදී ලැබූ රු. 3,130,908 ක් වූ පොලිය ආදායම ප්‍රකාශනයේ සංස්ථාව ඉපයූ අනෙකුත් ආදායම් ලෙස දක්වා තිබුණි.

(ඔ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන කුලී ණයගැතියන් තුළ පහත අසාමාන්‍ය තත්ත්වයන් නිරීක්ෂණය වූ බැවින් කුලී ණයගැති ශේෂය පිළිබඳ විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

(i). 2011 දෙසැම්බර් 31 දිනට කුලී ණයගැතියන් රු. 47,680,654 ක් වූ අතර අඩමාණ ණය වෙන්කිරීම රු. 68,539,508 ක් එනම් සියයට 144 ක අසාමාන්‍ය ප්‍රතිශතයක් ගෙන තිබුණි. ඒ අනුව ණයගැති ශේෂය ඉක්මවා රු. 20,858,854 ක අඩමාණ ණය වෙන්කිරීම් සිදුකර තිබුණි.

(ii). කුලීණයගැතියන්ගේ ඉකුත් වර්ෂයේ පැවති ශේෂය රු. 76,871,289 කින් අඩු වී තිබුණද එය සිදු වූයේ ණය ආපසු ලැබීමෙන්ද බොල්ණය කපාහැරීමෙන්ද වෙනත් හේතුවකින්ද යන්න තහවුරු කර ගැනීමට ජ්නල් සටහන් හෝ වෙනත් සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවිය.

(iii). කුලී ආදායම තුළ විදුලි බිල්පත්, ජල බිල්පත් සහ වෙනත් මිලදී ගැනුම් ගණුදෙනු ඇතුළත් වී ඇති බැවින් කුලී ණයගැතියන්ගේ නිවැරදිතාවය පිළිබඳ සෑහීමකට පත්විය නොහැක.

(ඕ). වී සහල් කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් සංස්ථාව විසින් දරන ලද ප්‍රවාහන වියදම් රු. 7,785,329 ක් , වී කෙටීමේ ගාස්තු රු. 15,117,351 ක් සහ පොලිසැක් මලු මිලදී ගැනීමේ වියදම් රු. 2,491,305 ක් සංස්ථාවට ලැබිය යුතු ආදායමක් වුවද එය විකුණුම් පිරිවැය තුළ සෘජු පිරිවැයක් ලෙස ද්විත්ව සටහන් මූලධර්ම වලින් බැහැරව ගිණුම්ගත කර තිබීමෙන් මූල්‍ය ප්‍රකාශන වල විකෘති තත්ත්වයක් නිරූපනය වී තිබුණි.

### 2.2.5 පැහැදිලි නොකළ වෙනස්කම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 අප්‍රේල් මාසයේ දී ඉදිරිපත් කළ 2011 මූල්‍ය ප්‍රකාශනයේ දැක්වුණු අගයන් හා පසුව ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනවල අගයන් වෙනස් වී තිබුණද ඊට හේතුන් ඉදිරිපත් කර

නොතිබූ අතර ගිණුම් විෂයයන් විසිහතරක එකතුව රු. 15,903,461,552 ක වෙනසක් නිරීක්ෂණය විය. මෙයට අතිරේකව සමූපකාර වක්‍රීය අරමුදලේ අලාභයේද රු. 35,919,947ක වෙනසක් නිරීක්ෂණය වූයෙන් මූල්‍ය ප්‍රකාශන වලට කර ඇති ගැළපීම් පිළිබඳව විගණනයට විශ්වාසය තැබිය නොහැක.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ එකතු කිරීම් ලෙස විස්තරාත්මක උපලේඛන තුළ දක්වා තිබූ රු. 250,266 ක පිරිවැය වූ වත්කම් සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට හා 2011 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ක්ෂය යටතේ දක්වා තිබූ අතර මෙම මිලදී ගැනීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් ගලායෑමේ ප්‍රවාහයක් ලෙස ද දක්වා තිබුණි. ඉහත රු. 250,266 ක් වූ එකතු කිරීම් වලින් වර්ෂය තුළ අපහරණය කරන ලද රු. 45,500 ක් හිලව්කර මූල්‍ය ප්‍රකාශන තුළ රු. 204,766 ක් ලෙස දක්වා තිබුණි.

(ඇ) අනෙකුත් ණයහිමියන් තුළ ටීආර් ණය ලෙස වාණිජ බැංකුවක නමින් රු. 207,050,943 ක් දක්වා තිබූ නමුත් බැංකු ශේෂ තහවුරු කිරීමේ ලිපිය අනුව එම ණය ශේෂය රු. 207,097,942 ක් වූයෙන් රු. 46,999 ක වෙනසක් නිරීක්ෂණය විය. එමෙන්ම එම ලිපිය අනුව 2011 දෙසැම්බර් 31 දිනට රු. 21,197,751 ක ගෙවිය යුතු ගාස්තුවක් පිළිබඳ දක්වා තිබූ නමුත් එම මූල්‍ය වියදම සමාලෝචිත වර්ෂයේ දී ගිණුම්වල ගලපා නොතිබුණි.

(ඈ) 2011 වර්ෂය තුළදී රු. මිලියන 242.5 ක් සමූපකාර සංවර්ධන කොමසාරිස්වරයාගෙන් ලැබී තිබුණු අතර සැලසුමකින් තොරව ඉන් මිලදී ගැණුම් සිදුකර තිබීමත් වක්‍රීය අරමුදලට දැරිය නොහැකි රු. මිලියන 35.7 ක ක්‍රියාකාරී පිරිවැයක් දරා තිබීමත් අරමුදලේ බැංකු ගිණුමෙන් රු. මිලියන 104.2 ක් සංස්ථාවේ ඉතුරුම් ගිණුමට මාරු කිරීමත්, මගින් සමූපකාර වක්‍රීය අරමුදලේ මුදල් සමූපකාර තොග වෙළඳ සංස්ථාව උපයෝජනය කර තිබීම සමූපකාර වක්‍රීය අරමුදලෙන් රු.මිලියන 72.4 ක අලාභයක් ලැබීමට හේතුව බැව් විගණනයේදී බැහැර කළ නොහැක.

(ඉ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් හා මුදල් සමාන දෑ ලෙස දක්වා තිබූ වටිනාකම රු. 1,730,281 ක් වූ ශේෂයට අදාල ලෙජරයේ තිබූ බැංකු ගිණුමට අදාල සටහන් පිළබඳ විගණන පරීක්ෂාවේදී බැංකු ගිණුමේ හර පැත්තේ රු. 6,842,728 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන එකතුව රු. 2,342,123,613 ක් වූ වත්කම් ගිණුම් ශේෂ 12 ක් ද, එකතුව රු. 1,601,578,520 ක් වූ වගකීම් ගිණුම් ශේෂ 08 ක් ද ,රු.139,690,713 ක් වූ ආදායම් ගිණුම් ශේෂ දෙකක් ද, රු. 542,164,547 ක් වූ හිමිකම් ගිණුම් ශේෂයක් ද ලෙස මුළු එකතුව රු. 4,625,557,393 ක් සම්බන්ධයෙන් සාක්ෂි නොමැති වීම හේතුවෙන් එම විෂයයන් සතුටුදායක ලෙස සත්‍යාපනය/සත්‍යතාවය කිරීමට හෝ පිළිගැනීමට හෝ නොහැකි විය.

(ආ) ජංගම වගකීම් යටතේ ගෙවිය යුතු වටිනාකම් ලෙස දැක්වෙන එකතුව රු. 110,975,798 ක් වූ ගිණුම් ශේෂ 9 ක් නිශ්චිතව හඳුනාගැනීමට කළමණාකාරිත්වය විගණිත දිනය දක්වා අපොහොසත් වී තිබුණි.

## 2.2.7 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වැලිසර ගබඩා සංකීර්ණයේ පිහිටුවා තිබූ ලක් සතොස වෙත පවරා දෙනු ලැබූ එකතුව රු.126,156,746 ක් වූ වත්කම් වෙනුවෙන් කිසිදු මුදලක් 2014 ඔක්තෝම්බර් මාසය වන විටත් ලැබී නොතිබුණි. කෙසේ වෙතත්, මෙම මුදල ස්ථාවර වත්කම් තුළ ඇතුළත් වී ඇති බවට ගිණුම් වල හෙළිදරව් කර හෝ ගිණුම් ගතකර ඇති ආකාරය තහවුරු කිරීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි.

(ආ) 2011 දෙසැම්බර් 31 දින වන විට ආයතන හා පුද්ගලයන් 145 දෙනෙකුගෙන් සංස්ථාවට ලැබිය යුතු වර්ෂ හතරකට වඩා පැරණි කුලී ආදායම රු. 87,560,470 ක් වූ අතර, මෙම මුදල් අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග 2014 ඔක්තෝබර් අවසන් වන විටත් ගෙන නොතිබුණි. 2009 වර්ෂයේ සිට අයවිය යුතුව තිබූ රු. මිලියන 47.6 ක් වූ බදු කුලී ආදායම අයකර ගැනීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි.

(ඇ) 2004 හා 2005 වර්ෂ වල දී සහල් සහ තිරිඟු පිටි ආනයනය කිරීම සඳහා භාණ්ඩාගාරයේ සුරැකුම් මත රාජ්‍ය බැංකුවක් විසින් සංස්ථාව වෙත ලංසු සුරැකුම් ණය රු. 207,050,943 ක් ලබා දී තිබුණු අතර, එය 2014 දෙසැම්බර් 31 දින වන විටත් පරිශේෂව පැවතුණි.

(ඈ) සතොස වෙතින් වී අලෙවි මණ්ඩලයට ගෙවිය යුතු රු. 341,388,591 ක් වූ ශේෂයක් පවතින බවට වී අලෙවි මණ්ඩලයේ 2011 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් තහවුරු කර තිබුණ ද සතොස මූල්‍ය ප්‍රකාශන වල එය රු. 95,931,317 ක් ලෙස දක්වා තිබුණි. මෙම බැරකම පියවා දැමීමට මෙතෙක් සංස්ථාව අපොහොසත් වී ඇති අතර මෙම වෙනස නිරවුල් කිරීමට ද මෙතෙක් කටයුතු කර නොතිබුණි.

## 2.3 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ13 (6) වගන්තිය | මූල්‍ය ප්‍රකාශන සමඟ ගිණුම් පිළිබඳ වාර්තාවක් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනතේ 2 හා 8 වගන්ති | රු. පනස් ලක්ෂය ඉක්මවන්නා වූ සෑම පොදු කොන්ත්‍රාත්තුවක්ම මෙම වගන්ති ප්‍රකාරව සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි විය යුතු වුවද සංස්ථාව ප්‍රදානය කර තිබූ එකතුව රු. 40,146,175 ක් වූ කොන්ත්‍රාත්තු 05 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 1991 අංක 31 දරන සමූපකාර තොග වෙළඳ සංස්ථා (සංශෝධිත) පනතේ 2.2 (අ) වගන්තිය | සංස්ථාවට ආයෝජනය කළ හැක්කේ පවත්නා පොදු සමාගම් වල වුව ද ඊට පටහැනිව හා අමාත්‍ය මණ්ඩල හෝ භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතියක් නොමැතිව සී/ස සතොස ආර්ථික මධ්‍යස්ථාන සේවා පෞද්ගලික සමාගම නමින් පෞද්ගලික සමාගමක් ස්ථාපිත කර සංස්ථාවෙන් වැටුප් ලබන නිළධාරීන් සේවයේ යොදවා තිබුණි. |

| | |
|---|---|
| (ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.3 වගන්තිය | මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය නොමැතිව සංස්ථාව විසින් පිහිටුවන ලද පෞද්ගලික සමාගමක් වෙත රු.5,124,018 ක මුදලක් ලබා දී තිබුණි. |
| (ඉ) 2009 ජුනි 01 දිනැති අංක 30 හා 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛ | ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව පිළිබඳ හා රජයේ වැටුප් හා දීමනා පිළිබඳ රෙගුලාසි හා නියමයන් කෙරෙහි අවධානය යොමු නොකර සේවකයින් 65 දෙනකු බඳවාගෙන නිසි අනුමැතියකින් තොරව උසස්වීම් ලබා දී විවිධ වැටුප් තල වල පිහිටුවා තිබුණි. |

## 3 මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද ආදායම් ප්‍රකාශය අනුව, සමාලෝචිත වර්ෂයේ ශුද්ධ අලාභය රු. 313,605,785 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ අලාභය රු. 321,512,555 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී රු. 7,906,770 කින් ශුද්ධ අලාභය අඩුවී තිබුණි. එහෙත් සමුපකාර චක්‍රීය අරමුදලේ හා සංස්ථාවේ විකුණුම් නිෂ්චිතව හඳුනාගෙන වෙන් වෙන්ව ගිණුම්ගත නොකිරීමත් පසුගිය වර්ෂයේ අවසාන තොගය සමාලෝචිත වර්ෂයේ ආරම්භක තොගය ලෙස රු. 79,297,166 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වලට ගෙන තිබීමත් තුළින් රු.26,558,554 ක දළ අලාභයක් බවට පරිවර්තනය වීමත් නිසා (විගණනය විසින් මෙහෙයුම් හා මූල්‍ය වියදම් සම්බන්ධව දක්වා ඇති නිරීක්ෂණවල බලපෑමද නොසලකා හැරියද) අවම වශයෙන් ශුද්ධ අලාභය රු. 69,090,283 ක් විය යුතුව තිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන වල පෙන්වා ඇති සියයට 344 ක වර්ධනය සියයට 3104 ක පිරිහීමක් බවට පරිවර්තනය වනු ඇත

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

| | 2011 | 2010 |
|---|---|---|
| (i). ලාභ අනුපාත | | |
| - දළ ලාභය සියයට | 17 | 1 |
| - මෙහෙයුම් ලාභය සියයට | 10 | 13 |
| - ශුද්ධ ලාභය සියයට | 3 | 1 |
| (ii). මෙහෙයුම් ආදායමට මෙහෙයුම් වියදම් අනුපාත සියයට | 41 | 46 |
| (iii). ද්‍රවශීලතා අනුපාත | | |
| - ජංගම | 0.66:01 | 0.47:01 |
| - ක්ෂණික වත්කම් | 0.58:01 | 0.39:01 |
| (iv). තොග පිරිවැටුම් අනුපාතය | 3.71 | 2.37 |
| (v). සේවක මණ්ඩල වියදම් විකුණුම්අනුපාතය | 1:3 | 1:2 |
| (vi). මුළු වත්කම් වලට ශුද්ධ වත්කම් අනුපාතය | (2.82) | ( 3.23) |
| (vii). ප්‍රාග්ධන තෝලන අනුපාතය | (1):1.1 | (1):1.1 |
| (viii). සංචිත අනුපාතය | ( 47%) | ( 52%) |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අදාළ මෙම වාර්තාවේ දැක්වෙන 2.2.3 හා 2.2.5 හි නිරීක්ෂණ අනුව සමාලෝචිත වර්ෂයේ ගිණුම් ශේෂවල සහ ඉදිරිපත් කරන ලද, පෙර වසරේ සංසන්දනාත්මක ශේෂයන්ගේ පවතින නොඑකඟතාවන් නිසා ඉහත අනුපාත විශ්ලේශනය මඟින් විග්‍රහාත්මක සමාලෝචනයක් කළද එය ඵලදායීව විගණනය සඳහා යොදා ගැනීමේ බොහෝ දුෂ්කරතා මතු වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂය හා සමාලෝචිත වර්ෂයේ කාර්යමණ්ඩල වියදම් වලට විකුණුම් අනුපාතය පිළිවෙලින් 1:2 හා 1:3ක් ලෙස නිරූපණය වීමෙන් මුළු විකුණුම් ආදායමෙන් 1/2ක් හා 1/3ක්වශයෙන් ඉතා අධික කාර්ය මණ්ඩල වියදමක් සංස්ථාව විසින් දරා තිබුණි.

(ඇ) සංස්ථාවේ ප්‍රාග්ධන තෝලන අනුපාතය ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂ සමඟ සැසඳීමේදී වර්ෂයක් පාසා ප්‍රාග්ධනය බාදනය වීම හේතුවෙන් අධිතෝලන තත්ත්වයක් ඇතිවී සංස්ථාවේ ප්‍රාග්ධන ව්‍යුහය දැඩි අවදානමකට ලක් වෙමින් පැවති බව නිරීක්ෂණය විය. එමෙන්ම සංස්ථාවේ ප්‍රාග්ධන බාදනය හේතුවෙන් සංචිතවල පිරිහීමේ පරාසය සියයට 47 ත් 52ත් අතර විය.

(ඈ) මුළු වත්කම් වල වටිනාකම මෙන් 3 ගුණයක් බැගින් ශුද්ධ වත්කම් (හිමිකම් ප්‍රාග්ධනය) බාදනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 භෞතික කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංයුක්ත සැලැස්මේ දැක්වෙන 2011 වර්ෂයේ ක්‍රියාකාරීත්වයට අනුව, සහල් සැකසීම සඳහා වැය කිරීමට අපේක්ෂිත කාලය පැය 4,608 ක් වුවත් තථ්‍ය වශයෙන් වැයකර තිබූ කාලය පැය 3,561 ක් විය. කෙසේ වුවත් වැඩකරන ලද පැය 3,561 ක් සඳහා මිලදී ගත යුතු වී ප්‍රමාණය කි.ග්‍රෑ. 4,006,125 ක් (1500 x 75% x 3561) වුව ද, තථ්‍ය වශයෙන් මිල දී ගෙන තිබුණේ වී කි.ග්‍රෑ. 3,506,083 ක් වූයෙන්, වී කි.ග්‍රෑ. 500,042 ක් අඩුවෙන් මිල දී ගෙන තිබුණි. එහෙයින් සංස්ථාවේ සහල් මෝල් කළමනාකරණ කටයුතු දුර්වල මට්ටමක පැවතිණි.

(ආ) මිල දී ගත් වී ප්‍රමාණයෙන් සහල් විය යුතු බවට ප්‍රමිත කළ ප්‍රමාණය කි.ග්‍රෑ. 2,349,075 ක් (3,506,083 x 67%) වුව ද, තථ්‍ය වශයෙන් සහල් තිබුණේ කි.ග්‍රෑ. 2,230,400 ක් පමණි. ඒ අනුව සහල් කි.ග්‍රෑ. 118,675 ක් අඩුවෙන් නිෂ්පාදනය වී තිබීම අසාමාන්‍ය බැහැරවීමක් බව විගණනයේ දී නිරීක්ෂණය කෙරේ.

(ඇ) සහල් සැකසීමේ කටයුතු සඳහා වී අලෙවි මණ්ඩලයෙන් ලබා ගන්නා වී ප්‍රමාණයන් පිළිබඳ ඉලක්කයන් සංයුක්ත සැලැස්මෙහි හෝ ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුළත් කර නොතිබුණ ද, වී අලෙවි මණ්ඩලයෙන් මෙ.ටො. 5942.104 ක් මිල දී ගෙන තිබුණි.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වටිනාකම රු. 5,097,455 ක් වූ "බහාළුම් යන්ත්‍ර" 12 හි විදුලි මෝටර් අස්ථානගතවීම් සම්බන්ධව වත්කම් භාරය, වගකීම් පැවරීම පිළිබඳව නිශ්චය කිරීමෙන් හා ඒ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් කර වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගෙන ඔවුන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) බජට් ෂොප් පවත්වාගෙන යාම වෙනුවෙන් සංස්ථාවට අයත් ගොඩනැගිලි 05 ක් කුලියට දීමේ දී අදාළ පාර්ශව සමඟ විධිමත් පරිදි නෛතික ගිවිසුම් වලට එළඹී නොතිබුණු අතර, රජයේ තක්සේරුකරුගේ තක්සේරුවක් ලබාගෙන කුලී තීරණය කිරීමට ද කටයුතු කර නොතිබුණි.

(ඇ) සංස්ථාව සතු අලෙවි සැල් හා ගබඩා ගොඩනැගිලි 29 ක ගොඩනැගිලි කුලිය සම්බන්ධයෙන් රජයේ තක්සේරුකරු මගින් තක්සේරු කර නොගෙන රාජ්‍ය සමාගමක් වන සී/ස ලංකා සතොස සමාගමට කුලියට ලබා දී තිබුණි.

(ඇ) 2010 නොවැම්බර් 03 දින වන විට සංස්ථාවට අයත් එකතුව රු. 51,718,227 ක් වූ වත්කම් සී/ස ලංකා සතොස සමාගමට පවරා දී තිබුණු අතර, ඒ වෙනුවට මුදල් ලබා ගැනීමට හෝ සමාගමේ කොටස් ලබා ගැනීමට හෝ විධිමත් එකඟතාවයකට එළඹ නොතිබුණි.

(ඉ) සමූපකාර චක්‍රීය අරමුදලේ ගිණුමෙන් රු. මිලියන 14.9 ක්ද සමූපකාර කොමසාරිස්වරයාගෙන් සෘජුව ලද රු. මිලියන 30 ක්ද සමූපකාර තොග වෙළඳ සංස්ථාවේ මෙහෙයුම් කටයුතු සඳහා යොදවාගෙන තිබීමෙන්, චක්‍රීය අරමුදලෙන් ලැබුණු මුදල් චක්‍රීය අරමුදලේ අරමුණු වෙනුවෙන් යොදාගෙන නොතිබුණු බැව් විගණනයේදී බැහැර කළ නොහැක.

**4.3 ආර්ථික නොවන ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරණු ලැබේ.

(අ) සංස්ථාව විසින් සතොස සිල්ලර සමාගමේ හා ඉන්ග්‍රීන් ඉන්ස්ටිටියුට් ඔෆ් ප්‍රින්ටින් ඇන්ඩ් ග්‍රැෆික්ස් සමාගමේ පිළිවෙලින් රු. 171,928,690 ක් සහ රු. 9,923,710 ක් වශයෙන් එකතුව රු. 181,852,400 ක් 1999 වර්ෂයේ දී ආයෝජනය කර තිබුණි. එයින් සතොස සිල්ලර

සමාගම පාඩු සිදුවීම හේතුවෙන් 2005 ජූනි මාසයේ සිට අකර්මන්‍ය තත්ත්වයට පත් වී තිබුණෙන් 2006 ඔක්තෝබර් 23 දින කොළඹ දිසා අධිකරණය ප්‍රකාශ කළ තීන්දුව ප්‍රකාරව එය විසුරුවා හැරීමට නියෝග කර තිබූ අතර එහි ආයෝජිත මුදල් ආපසු ලබාගැනීම අවිනිශ්චිත තත්ත්වයක පවතින බව නිරීක්ෂණය විය. ඉන්ග්‍රින් ඉන්ස්ටිටියුට් ඔෆ් ප්‍රින්ටින් ඇන්ඩ් ග්‍රැෆික්ස් සමාගමෙන් ද අදාළ ආයෝජනය සඳහා 1999 සිට 2011 දක්වා කාලපරිච්ඡේදය සඳහා කිසිදු ලාභාංශයක් සංස්ථාව වෙත ලැබී නොතිබුණි. සතොස විසින් සතොස සිල්ලර සමාගමේ කර තිබූ ඉහත ආයෝජනය ඇතුළුව එම සමාගමෙන් සතොස වෙත අයවිය යුතුව තිබූ එකතුව රුපියල් මිලියන 534 වූ මුදල වෙනුවෙන් රු. මිලියන 42 ක් පමණක් 2013 ජූනි 07 දින සංස්ථාව වෙත ලැබුණු බව මූල්‍ය ප්‍රකාශන අනුව දක්වා තිබුණි.

(ආ) සංස්ථාවේ වාර්ෂික අයවැය මඟින් සංග්‍රහ වියදම් සඳහා රු. 134,000 ක් වෙන්කර තිබුණද වර්ෂය තුළ සංග්‍රහ වියදම් වෙනුවෙන් රු. 1,494,791 ක් වැයකර තිබුණි.

## 4.4 ප්‍රතිව්‍යුහගත කිරීමේ ගනුදෙනු

පහත කරුණු අනාවරණය විය.

2003 වර්ෂයේදී සංස්ථාව ප්‍රතිව්‍යුහගත කිරීම ආරම්භ වී තිබුණු අතර, 2003 දෙසැම්බර් 01 දිනට වාණිජ බැංකු 6 කට ගෙවිය යුතුව තිබුණු රු. මිලියන 5,493 ක් වූ ණය මුදලින් රු. මිලියන 4,397 ක් ගෙවා නිරවුල් කිරීමට වාණිජ බැංකු එකඟ කරවාගෙන ඒ වෙනුවෙන් වසර 13 කින් කල්පිරෙන භාණ්ඩාගාර බැඳුම්කර අදාළ වාණිජ බැංකු වෙත නිකුත් කර තිබුණි. එම භාණ්ඩාගාර බැඳුම්කර සංස්ථාව සතු ස්ථාවර වත්කම් වලින් රු. බිලියන 1.8 ක වත්කම් රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂම මඟින් විකුණා ලැබෙන මුදලින් 2005 වර්ෂයේ දී නිරවුල් කිරීමටත්, එම බැඳුම්කර ණය වෙනුවෙන් අර්ධ වාර්ෂිකව පොලී ගෙවීමටත්, ගෙවිය යුතු පොලියෙන් සියයට 50 භාණ්ඩාගාරය විසින් දැරීමටත් ඉතිරි සියයට 50 සතොස සතු දේපළ සතොස රිටේල් සමාගමට කුලියට දීමෙන් ලැබෙන කුලී ආදායමින් ගෙවීමටත් එකඟ වී තිබුණු නමුත් ප්‍රතිව්‍යුහගතකරණය යටතේ භාණ්ඩාගාර බැඳුම්කර වෙනුවෙන් වූ වගකීම් නිරවුල් කිරීමට, රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂම වෙත වත්කම් පැවරීමක් සිදු කර නොතිබුණි. කෙසේ වුව ද 2004 පෙබරවාරි 03 දිනැති අංක 04/0103/136/007/EPC/710 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සංස්ථාව විසුරුවා හැරීමට සහ පුද්ගලීකරණය කිරීමට ගන්නා ලද තීරණය 2004 අගෝස්තු 11 දිනැති අංක 04/0892/012/001 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි නතර කෙරුණි.

ඒ අනුව කල් පිරුණු අගය රු. මිලියන 4,397 ක් වූ භාණ්ඩාගාර බැඳුම්කර සියයට 8.5 වට්ටම් සාධකය යටතේ එම බැඳුම්කර වල 2011 දෙසැම්බර් 31 දිනට ශුද්ධ වර්තමාන අගය වූ රු. මිලියන 2,924 ක් ද, රු.මිලියන 1,472 ක වට්ටම් අගයක් ද එකතු කිරීමෙන් ලැබුණු එම රු. මිලියන 4,397 කල් පිරුණු අගයට, ණය මුදල් නිරවුල් කිරීම වෙනුවෙන් සතොස රිටේල් සමාගමේ ණය හිමියන් හා ඉහත බැංකු 06 අතුරින් වාණිජ බැංකු 03 කට තවදුරටත් භාණ්ඩාගාරය විසින් ගෙවූ වට්නාකම් වෙනුවෙන් භාණ්ඩාගාරයට ගෙවිය යුතු රු. මිලියන 200 ද සහිතව එකතුව (4397+200) රු. මිලියන 4,597 ක් බැඳුම්කර වගකීම ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

මීට අදාළව භාණ්ඩාගාරයට ගෙවිය යුතු බැඳුම්කර පොළී වගකීම වූ රු. 2,482,355,130 ක වටිනාකම " බැඳුම්කර පොළී සඳහා භාණ්ඩාගාර ප්‍රදාන " නමින් මූල්‍ය ප්‍රකාශන තුල ජංගම නොවන වගකීම් යටතේ දක්වා තිබුණි.

තවද මෙම ගෙවිය යුතු රු. මිලියන 4,597 න් රු. මිලියන 200 ක ශේෂය භාණ්ඩාගාරය වෙත ලැබිය යුතු වටිනාකමක් ද යන්න භාණ්ඩාගාරය වෙතින් තහවුරු කරවා ගැනීමට කළමනාකාරිත්වය අපොහොසත් වී තිබුණු අතර අනෙකුත් ණය හිමියන් යටතේ ප්‍රතිව්‍යුහගත කිරීම් ලෙස රු. 66,363,460 ක් දැක්වීමෙන් ප්‍රතිව්‍යුහගත කිරීමේ ගණුදෙනුව නිසි පරිදි හෙළිදරව් කර හෝ ගැලපීම් කර නොමැති බැව් පැහැදිලි වේ. මෙම ප්‍රතිව්‍යුහගත කිරීමේ අගය වූ රු. මිලියන 66 පරිගණකගත ගිණුම් පද්ධතිය තුළ දක්වා තිබුණේ පොත් තැබීම් ලෙසය.

### 4.5 දූෂ්‍ය වංචනික ගනුදෙනු

---

2009 හා 2010 වර්ෂ වල දී සිදු වූ බේකරි නිෂ්පාදන අලෙවියේ දී එකතුව රු. 1,321,285 ක් වූ මුදලක් වංචා කර ඇති බව අනාවරණය වී තිබුණ ද, ඊට අදාළ නෛතික ක්‍රියාමාර්ග 2015 අප්‍රේල් 30 දින දක්වා ගෙන නොතිබුණි.

### 4.6 අසම්භාව්‍ය වගකීම්

---

2011 වර්ෂය අවසන් වන විට සංස්ථාවට එරෙහිව විවිධ පාර්ශවයන් විසින් නඩු 59 ක් ගොනුකර තිබුණු අතර, මූල්‍ය ප්‍රකාශන වලින් ඒවා හෙළිදරව් කර නොතිබුණි.

## 4.7 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

කුලී පදනම මත ලබාගත් ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවට අයත් හිඟුරක්ගොඩ පිහිටි ගබඩා 02 ක රු. 78,978,504 ක වියදමක් දරා වී මෝල් ඉදිකර තිබුණි.

## 4.8 නිෂ්ක්‍රිය වත්කම්

2006 සැප්තැම්බර් මාසයේ දී එවකට රේඛීය අමාත්‍යාංශයේ උපදෙස් මත සංස්ථාව විසින් රු. 14,501,998 ක් වූ සහල් සැකසීම් යන්ත්‍ර 140 ක් ආනයනය කර තිබුණි. 2011 වර්ෂය අවසන් වන විටත් මෙම සහල් සැකසීමේ යන්ත්‍ර ප්‍රයෝජනයට ගැනීමට සංස්ථාව කටයුතු කර නොතිබුණු අතර 2014 නොවැම්බර් වන විටත් මෙම යන්ත්‍ර සංස්ථාව තුළ නිෂ්ක්‍රියව පැවතුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාර ගිණුම් වර්ෂය ඉකුත් වී ඊලඟ වර්ෂයේ පෙබරවාරි 28 දිනට ප්‍රථම සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුව ද 2011 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 11 දින විගණනය වෙත ඉදිරිපත් කරන ලදුව ඒවා ආපසු ලබාගෙන නැවත සංශෝධිත නව මූල්‍ය ප්‍රකාශන ලෙස 2014 ජූනි 09 දින ඉදිරිපත් කර තිබුණි.

(ආ) සමූපකාර චක්‍රීය අරමුදලේ ගෙවීම් වවුචර් සහ සංස්ථාවේ ගෙවීම් වවුචර් එකට ගොනුකර තිබීමත්, සංස්ථාවේ ආදායම් වියදම් වලින් සමූපකාර චක්‍රීය අරමුදලේ ආදායම් වියදම් වෙන්ව හඳුනාගත හැකි වනසේ පැහැදිලි ලෙජර් ගිණුම් නඩත්තු නොකිරීමත් නිසා මෙම ගනුදෙනු විනිවිදභාවයෙන් යුතුව සිදුවූයේ ද යන්න ගැටළු සහගත විය.

## 5.2 සංයුක්ත සැලැස්ම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5 ඡේදය ප්‍රකාරව සංස්ථාවේ දර්ශනය හා මෙහෙවර ඉටුකර ගැනීම සඳහා 2011 සිට 2013 දක්වා ආවරණය වන පරිදි සංයුක්ත සැලැස්මක් සකස් කර තිබුණ ද එය කාලානුරූපව සමාලෝචනය කර නොතිබුණි.

## 5.3 ක්‍රියාකාරී සැලැස්ම

2011 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් විගණනය වෙත ඉදිරිපත් කර තිබුණ ද එය 2008 දෙසැම්බර් 31 දිනැති අංක 142 දරන රාජ්‍ය අයවැය චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි.

## 5.4 අයවැය පාලනය

අයවැයගත හා තථ්‍ය අගයන් අතර, සියයට 53 සිට සියයට 97 දක්වා සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූ හෙයින් අයවැය ලේඛණය ඵලදායී කළමණාකරන පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින් වර සංස්ථාවේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. ඒ අනුව පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) ස්ථාවර වත්කම් පාලනය
(ඇ) තොග පාලනය
(ඈ) බදු කුලී ආදායම
(ඉ) සේවක මණ්ඩල කළමනාකරණය
(ඊ) අභ්‍යන්තර විගණනය

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) (C) වගන්තිය ප්‍රකාර
2011.12.31 දිනට අවසන් වසර සඳහා සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ ගිණුම්
සම්බන්ධයෙන් විගණකාධිපතිතුමාගේ වාර්තාව.

2015 ජූලි මස 17 දිනැති අංක ටීසී/ඩී/සීඩබ්ලිව්ඊ/1/11/එෆ්ඒ/03 දරණ ලිපිය සම්බන්ධයෙනි. ඉහත වාර්තාව සම්බන්යෙන් පහත සඳහන් කර ඇති අපගේ නිරීක්ෂණයන් මේ සමඟ ඉදිරිපත් කරමි.

සභාපතිගේ අදහස් දැක්වීම

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමණාකරණයේ වගකීම

1.3 විගණනයේ වගකීම

2. මූල්‍ය ප්‍රකාශන

2.1 විගණන මතය

2.2 මූල්‍ය ප්‍රකාශන පිලිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ල.ගි.ප්‍ර.)

(අ) ශ්‍රී ල.ගි.ප්‍ර.03 :- එකඟ වේ. 2012 ගිණුම් ප්‍රකාශණ තුල අදාල තත්ත්වයන් නිවැරදි කිරීමට කටයුතු සිදු කර ඇත.

(ආ) ශ්‍රී ල.ගි.ප්‍ර.05 :- තොග හඳුනා ගැනීම්, ගිණුම්ගත කිරීම් හා හෙළිදරව් කිරීම් සම්බන්ධයෙන් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිය අවසාන ගිණුම්හි පිටු අංක 09 හි ගිණුම්කරණ ප්‍රතිපත්ති හි "Inventories" යටතේ දක්වා ඇත.

(ඇ) ශ්‍රී ල.ගි.ප්‍ර.09 :- 2.2.2 මේ සඳහා පිලිතුරු 2014.09.30 දිනැති TC/D/CWE/FA/AQ/2011/2014 සංශෝධිත මූල්‍ය ප්‍රකාශණ විගණනය 2011 දරණ විගණන විමසුමෙහි අංක 01 යටතේ පිලිතුරු සපයා ඇත. තවද මෙම වෙනස්කම අවසාන ගිණුම් සඳහා බලපෑමක් නොකරන බැවින්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාරක ප්‍රාග්ධනය විචලතාවය සඳහා ද බලපෑමක් සිදු කරනු නොලබයි.

2.2.3 (ඈ) ඔබ පෙන්වා දුන් තත්වය පිළිබඳව අප එකඟ වන අතර, කාරක ප්‍රාග්ධන විචලනයෙහි අවසන් පිලිතුර සඳහා එහි බලපෑමක් නොමැති බව දන්වා සිටිමි. නමුත් මෙකී තත්වය 2012 ගිණුම් තුල නිවැරදි කිරීමට කටයුතු සිදු කර ඇත.

2.2.3 (ඉ) මේ සඳහා පිලිතුරු 2014.09.30 දිනැති TC/D/CWE/FA/AQ/2011/2014 අංක 04 යටතේ සපයා ඇත. එබැවින් මෙකී තත්වය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාරක ප්‍රාග්ධන විචලතාවය ගණනය කිරීම සඳහා බලපෑමක් සිදු වී නැත.

2.2.3 (ඊ) 2014.09.30 දිනැති TC/D/CWE/FA/AQ/2011/2014 විගණන විමසුම යටතෙහි පිලිතුරු සපයා ඇත. එමෙන්ම කාරක ප්‍රාග්ධන විචලතාවයෙහි අවසන් පිලිතුර සඳහා මෙහි බලපෑමක් නොමැත.

2.2.3 (එ) ඔබ විසින් පෙන්වා දී ඇති තත්වය පිලිබඳ එකඟ වන අතර, මෙකී තත්වය නිවැරදි කිරීමට අවශ්‍ය ලිපිලේඛන සතොස සතුව නොපවති. කෙසේ වුවද ගිණුම්ගත වී ඇති තත්වයයට අදාලව කාරක ප්‍රාග්ධන විචලතාවය ගණනය කිරීම නිවැරදි වුවත්, ඔබ විසින් පෙන්වා දී ඇති තත්වය යටතේ කාරක ප්‍රාග්ධන විචලතාවය ගණනය කලහොත් එය කාරක ප්‍රාග්ධනය කෙරෙහි බලපෑමක් සිදු කරනු ලබන බව ද දන්වනු කැමැත්තෙමි.

(ඈ) ශ්‍රී.ල.ගි.ප්‍ර.18 :- (i) මෙම වත්කම් 2012 වර්ෂයට අදාලව ප්‍රත්‍යාගණනය කර ඉදිරිපත් කිරීමට කටයුතු කරගෙන යන බව දන්වමි.

(ii) වත්කම් සඳහා ක්ෂය ප්‍රතිපාදනය කිරීමේදී මිළදී ගත් වර්ෂය සඳහා ක්ෂය ගණනය කරනු ලබන අතර, ඉවත් කරන මුළු වර්ෂය සඳහාම ක්ෂය ගණනය කිරීම සිදු නොකරනු ලබයි. තවද 2009 වර්ෂයේදී මෙම අපහරණය කරන ලද රථ වාහන ප්‍රත්‍යාගණනය කිරීමක් සිදු කර ඇති අතර, එහිදී එතෙක් සිදු කළ සමුච්චිත ක්ෂය මුළු ප්‍රමාණය ඉවත් කර ඇත. නමුත් 2010 වර්ෂය සඳහා අළුතින් ක්ෂය ගණනය කිරීමක් සිදු කර නොමැති නිසා 2011 වර්ෂයේදී එම 2010 වර්ෂයට අදාල ක්ෂය ගණනය කිරීමක් සිදු කෙරිණි.

මෙහිදී ඔබ විසින් තවදුරටත් පෙන්වා දුන් රු.41,270,917/- ක වටිනාකමකින් යුත් වත්කම් සඳහා 2012 වර්ෂයේදී 2011 වර්ෂයට අදාල ක්ෂය ගණනය කිරීමට ද සටහන් කර ගනිමි.

| වත්කම් | අනුපාතය | පිරිවැය | ක්ෂය කළ වටිනාකම | ක්ෂය කළ කාලය |
|---|---|---|---|---|
| පරිගණක උපකරණ | 33 1/3 % | 2,104,510/- | 701,434/- | වර්ෂය |
| උපාංග (ප්‍රවාහන අංශය) | 10 % | 9,300/- | 930/- | වර්ෂය |
| උපාංග (ඇසුරුම් අංශය) | 10 % | 778,141/- | 77,814/- | වර්ෂය |
| ආයුධ (ගොඩනැගිලි දෙපාර්තමේන්තුව) | 10 % | 4,915,960/- | 306,474/- | |
| කාර්යාල උපකරණ | 10 % | 44,293/- | 4,429/- | වර්ෂය |
| වායු සමීකරණ සවි කිරීම් | 10 % | 416,000/- | 41,600/- | වර්ෂය |
| වායු සමීකරණ යන්ත්‍ර සවි කිරීම | 10 % | 641,725/- | 64,172/- | වර්ෂය |
| වායු සමීකරණ යන්ත්‍ර සවි කිරීම | 10 % | 97,750/- | 9,775/- | වර්ෂය |
| ගිඹුරක්ගොඩ (Grease Cutter) | 10 % | 13,750/- | 1,375/- | මාස 06 |
| වායු සමීකරණ යන්ත්‍ර සවි කිරීම | 10 % | 789,970/- | 39,498/- | මාස 06 |
| වායු සමීකරණ යන්ත්‍ර සවි කිරීම | 10 % | 469,975/- | 23,498/- | මාස 06 |
| වායු සමීකරණ යන්ත්‍ර සවි කිරීම | 10 % | 246,500/- | 12,325/- | මාස 06 |
| වායු සමීකරණ යන්ත්‍ර සවි කිරීම | 10 % | 330,000/- | 16,500/- | මාස 06 |
| වායු සමීකරණ යන්ත්‍ර සවි කිරීම | 10 % | 1,287,800/- | 64,390/- | මාස 06 |
| වායු සමීකරණ යන්ත්‍ර සවි කිරීම | 10 % | 578,197/- | 28,909/- | මාස 06 |

ගෘහ භාණ්ඩ හා සවි කිරීම් සඳහා වර්ෂය තුළ මිළදී ගැනීම් වෙනුවෙන් ක්ෂය ප්‍රතිපාදන සිදු නොකර ඇති අතර, ඒ සඳහා ක්ෂය ප්‍රතිපාදන 2012 වර්ෂයේ ගිණුම් තුළ සිදු කිරීමට අපේක්ෂිතය. අපහරණය කළ වාහන 2009 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය සිදු කර ඇති අතර, එහිදී එතෙක් සිදු කළ ක්ෂය ගිණුම් තුලින් ඉවත් කර ඇත. තවද එම වාහන සඳහා ක්ෂය 2011 වර්ෂයේදී ගණනය කර ඇත.

මෙම වත්කම් ක්ෂය කිරීම් වලට අදාල උපලේඛන අප සතුව පවතින අතර, මේවා ලබා දිය හැකි බව දන්වමි. මෙම අපහරණය කරන ලද වත්කම් 2009 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය සිදු කර 2011 වර්ෂයේදී අපහරණය කර ඇත. එහිදී ඒ සඳහා 2010 වර්ෂය වෙනුවෙන් පමණක් ක්ෂය ගණනය කිරීමක් සිදු කර ඇත. මේ සම්බන්ධව ඔබ වෙත සපයා ඇති 2011 වර්ෂය සඳහා ස්ථාවර වත්කම් සඳහා වන විස්තරාත්මක උපලේඛනය මගින් හඳුනාගත හැක.

(ඉ) ශ්‍රී.ල.ගි.ප්‍ර.26 :- 2012 වර්ෂයේදී ඉදිරිපත් කරනු ලබන ප්‍රකාශණ වලදී ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වමි.

(ඊ) ශ්‍රී.ල.ගි.ප්‍ර.40 :- 2012 වර්ෂයේදී ඉදිරිපත් කරනු ලබන ප්‍රකාශණ වලදී ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වමි.

1.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මේ සඳහා පිලිතුරු 2014.09.30 දිනැති TC/D/CWE/FA/AQ/2011/2014 සංශෝධිත මූල්‍ය ප්‍රකාශණ විගණනය 2011 දරණ විගණන විමසුමෙහි අංක 01 යටතේ පිලිතුරු සපයා ඇත. තවද මෙම වෙනස්කම අවසාන ගිණුම් සඳහා බලපෑමක් නොකරන බැවින්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාරක ප්‍රාග්ධනය විචලතාවය සඳහා ද බලපෑමක් සිදු කරනු නොලබයි.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සතොස ආයතනය සහල්, පිටි සහ සීනි ආනයනය කිරීම වෙනුවෙන් ලබා ගන්නා ලද මහජන බැංකු ණය මුදලක් වන රු.මිලියන 456 කින් රු.මිලියන 275 ක මුදලක් මහ භාණ්ඩාගාරය විසින් (පිටි මිළදී ගැනීමේදී වූ අලාභය ප්‍රතිපූර්ණය කිරීමක් වශයෙන්) ගෙන ඇත. එම මුදල ප්‍රතිව්‍යුහගත කරන ලද සංචිත යටතේ දක්වා ඇත. මෙය 2012 වර්ෂයේදී සංචිත වලින් ඉවත් කොට සමුච්චිත ලාභ / අලාභ ගිණුම් ශේෂයට ගැළපීම් කිරීම සඳහා කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලදි.

(ආ) i) ලංකා සතොස වෙත ලබා දී තිබූ ගොඩනැගිලි සඳහා වන බදු කුලිය සතොස වෙත ගෙවීම ආරම්භ කරන ලද්දේ 2011 අප්‍රේල් මාසයේ සිටය.

ii) සතොසට අයත් පරිපාලිත සමාගමක් වශයෙන් ලක් සතොස සමාගම වෙත මෙම වත්කම් පරිහරණය කිරීමට ලබා දී ඇති අතර, 2012 වර්ෂයේ පමණක් මෙය ආදායම් වශයෙන් ගිණුම්ගත කර ඇත.

(ඇ) මෙයින් කාරක ප්‍රාග්ධනයේ ශුද්ධ ප්‍රතිපලයට බලපෑමක් නොවන අතර, මෙය 2012 දී නිවැරදි කර ගැනීමට සටහන් කර ගතිමි.

(ඈ) i) 2012 ගිණුම් තුලින් නිවැරදි කර ගැනීමට සටහන් කර ගතිමි.

ii) සහ (iv) මෙම වාහන 2009 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය සිදු කර ඇති අතර, එහිදී එතෙක් කර තිබූ සම්මුච්චිත ක්ෂය 2009 වර්ෂයේදී ගිණුම් තුලින් ඉවත් කර තිබූ නමුත්, 2010 වර්ෂයේදී ඒ සඳහා ක්ෂය ගණනය කිරීමක් සිදු කර නොතිබුණි. එමනිසා ඒ වෙනුවෙන් ක්ෂය ගණනය කිරීම ආරම්භ කර තිබුණි.

iii) 2012 ගිණුම් තුලින් නිවැරදි කර ගැනීමට සටහන් කර ගතිමි.

(ඉ) මේ සඳහා පිලිතුරු TC/D/CWE/FA/AQ/2011/2014 අංක 04 යටතේ සපයා ඇත.

(ඊ) මේ සඳහා පිලිතුරු TC/D/CWE/FA/AQ/2011/2014 අංක 05 යටතේ සපයා ඇත.

(උ) ඔබ විසින් පෙන්වා දී ඇති තත්ත්වය ඉදිරිපත් කිරීමේ දෝෂයක් වන අතර, එය 2012 වර්ෂයේදී නිවැරදි කර ඇත. එමෙන්ම මෙහි දැක්වෙන අඩමාණ ණය වෙන් කිරීම 2010 වර්ෂයට අදාල වේ.

මෙය ගිණුම්කරණ සටහන් අංක 15 යටතේ දක්වා ඇත.

(ඌ) මේ සඳහා පිලිතුරු TC/D/CWE/FA/AQ/2011/2014 අංක 12 යටතේ සපයා ඇත. මෙය අළුත්වැඩියා හා නඩත්තු ගිණුමට හර කර ඇත.

(එ) මීට අදාල කිසිඳු ලිපිලේඛනයක් මූල්‍ය අංශය තුල නොමැති අතර, මෙයට අදාල පසුගිය වර්ෂයන්හී ගිණුම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව එකී ගණුදෙනු නිවැරදි කිරීමට කටයුතු කරන බව දැණුම් දෙමි. එමෙන්ම 2011 වර්ෂයට අදාල විගණන ගාස්තු 2012 වර්ෂයේ ගිණුම් තුල ගැලපීමට සටහන් කර ගතිමි. කරුණාකර අපගේ ගිණුම් තුල ඔබ විසින් දක්වා ඇති හිඟ ශේෂ ඇතුලත් කිරීම සඳහා අදාල ඉන්වොයිස් පත් සමඟ ශේෂ පිළිබඳ විස්තර අප වෙත ඉදිරිපත් කරන මෙන් ඉල්ලමි.

(ඒ) සමුපකාර දෙපාර්තමේන්තුව සමග එළැඹුණු ගිවිසුම් වලට අනුව මෙම අරමුදලේ කටයුතු වලට අදාල ගණුදෙනු සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ ගණුදෙනු නිසා වටිනාකම් සතොස මූල්‍ය ප්‍රකාශණ වල දක්වා ඇත. ප්ලාස්ටික් කූඩා තොග වල වටිනාකම 2012 වර්ෂයේදී ගැළපුම් කිරීමට සටහන් කර ගතිමි.

1.2.4 <u>මතභේදයට තුඩු දෙන ගණුදෙනු</u>

(අ) මෙය 1998 වර්ෂයේදී එවකට සිටි කළමණාකාරීත්වය විසින් රාජ්‍ය ප්‍රතිපත්ති මත ගනු ලැබූ තීරණයක ප්‍රතිඵලයකි. කෙසේ නමුත් මේ වන විට එම සහල් සැකසුම් මධ්‍යස්ථානය සතොස ආයතනය සතු ස්ථාවර වත්කමක් ලෙස තිබෙන අතර, එමගින් සහල් නිෂ්පාදන කටයුතු අඛණ්ඩව කරගෙන යනු ලබන බව දන්වමි.

(ආ) (i) 2012.10.12 දින වන විට ආයතනය පැවති තත්ත්වය පදනම් කරගෙන සහ ක්‍රියාත්මක කිරීමට යෝජිත විෂය ක්ෂේත්‍රයන් සැළකිල්ලට ගනිමින් විෂයභාර අමාත්‍යාංශයේ මග පෙන්වීම මත, කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කාර්ය මණ්ඩලයක් ලබා දී ඇත.

(ii) තවද ඒ සඳහා වන බඳවා ගැනීම් සහ උසස් කිරීම් පරිපාටියක් ද අනුමත කර ඇති අතර, ඒ අනුව සියළුම කාර්ය මණ්ඩලිකයන් එම අනුමත කාර්ය මණ්ඩලය තුලට අන්තර්ග්‍රහණය ද කර ඇත. කිරීමට නියමිත උසස් කිරීම් ආදිය ද එම පරිපාටීන් මත පමණක් සිදු කරනු ලැබේ.

(ඇ) මේ සඳහා පිලිතුරු අංක (ii) TC/D/CWE/FA/AQ/2011/2014 දරණ 2014.09.30 දාතමැති විගණන විමසුම යටතේ සපයා ඇත.

1.2.5 නොසැසඳුන පාලන ගිණුම්

(අ) මෙය මූල්‍ය ප්‍රකාශණ වල තොරතුරු හෙළිදරව් කිරීමේ වෙනසක් මිස ගණුදෙනු වල සිදු වූ වෙනසක් නොවන බව දන්වමි.

(ඇ) 2011 දෙසැම්බර් 31 දිනට තොගය සකස් වූ ආකාරය සටහන් අංක 11 හි පැහැදිලිව දක්වා ඇත.

| | |
|---|---:|
| වෙළඳ තොගය | 41,635,183.00 |
| ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ තොගය | 4,143,032.00 |
| ඇසුරුම් ද්‍රව්‍ය | 454,513.00 |
| ප්ලාස්ටික් කූඩා තොගය | 61,830,650.00 |
| සමුපකාර ව්‍යාපෘති තොගය | 29,799,522.00 |
| | 96,227,717.00 |
| මුළු තොගය | 137,862,900.00 |

| | |
|---|---:|
| 2010 මූල්‍ය ප්‍රකාශණ අනුව තොගය | 110,518,113.00 |
| වෙළඳ තොගය | 31,220,951.00 |
| සමුපකාර ව්‍යාපෘති තොගය | 74,699,622.00 |
| ගොඩනැගිලි දෙපාර්තමේන්තු තොගය | 4,143,032.00 |
| ඇසුරුම් ද්‍රව්‍ය තොගය | 454,513.00 |
| | 79,297,167.00 |

2.2.6 පැහැදිලි නොකළ වෙනස්කම්

(අ)

(1) ගබඩා යන්ත්‍ර මිළදී ගැනීම් වටිනාකම රු.196,350/- කි. මෙය සටහන් අංක 09 හි ද පැහැදිලිව දක්වා ඇත. එම වටිනාකම අපගේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේද නිවැරදිව පෙන්නුම් කර ඇත.

(2) ගබඩා උපකරණ සහ අධිශීතකරන වලට අදාලව උපලේඛන සකස් කිරීමේ වරදක් රු.45,500/- ක් ලෙස නිවැරදි කර ඇත. නමුත් එම අගයන් අප විසින් ගිණුම් වල ගැළපීමක් කර නොමැති අතරම අරමුදල් ප්‍රවාහ ප්‍රකාශයට ද ඇතුලත් කර නොමැත.

(3) රජයේ ඉඩම් වල ඉදි කරන ලද ගොඩනැගිලි වල අනුරාධපුර තොග ගබඩාව සඳහා රු.8,016/- ක අඩි ක්ෂය කිරීමක් 2011 වර්ෂයට ප්‍රථම සිදු කර ඇති අතර, එය ගැළපීම සඳහා එකතු කිරීමක් ලෙස දක්වා ඇත. වැරදීමකින් එහි වටිනාකම වූ රු.8,016/- ක් පමණක් අරමුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුලත් කර ඇත.

(ආ) TC/D/CWE/FA/AQ/2011/2014 හි අංක 03 (අ) යටතේ පිළිතුරු සපයා ඇත.

(ඇ) i මේ සඳහා පිලිතුරු TC/D/CWE/FA/AQ/2011/2014 03(අ) යටතේ සපයා ඇති අතර, රු.මිලියන 292.5 ක මුදල කාරක ප්‍රාග්ධන චක්‍රීය ප්‍රවාහය තුලින් ණයගැතියෝ, ණයහිමියෝ, මුදල්, තොග වශයෙන් කිහිප වරක්ම පරිවර්තනය වීම තුලින් විශාල ගැණුම්, විකුණුම් වටිනාකම් ලෙස පරිවර්තනය වී ඇත. එයට අදාල ගෙවිය යුතු මුදල සටහන් අංක 25 හි "Loan payable to Co-Operative Commissioner " යටතේ ගෙවිය යුතු වටිනාකමක් ලෙස දක්වා ඇත.

ii මේ සඳහා පිලිතුරු TC/D/CWE/FA/AQ/2011/2014 03(ආ)

iii මේ සඳහා පිලිතුරු TC/D/CWE/FA/AQ/2011/2014 03(ඇ)

iv මේ සඳහා පිලිතුරු TC/D/CWE/FA/AQ/2011/2014 03(ඈ)

v මේ සඳහා පිලිතුරු TC/D/CWE/FA/AQ/2011/2014 03(ඉ)

2.2.7 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

(අ) එකඟ වේ. 2011 ගිණුම්හි ලංකා සතොස ණයගැතියන් තුල මෙම ආයෝජන වටිනාකම් සහ ණයගැති වටිනාකම් යන අගයන් දෙකම ඇතුලත්ව ඇත. එකී ආයෝජන වටිනාකම හා ණයගැති ශේෂය වෙන් වෙන් වශයෙන් 2012 ගිණුම් තුල ඇතුලත් කිරීමට සටහන් කර ගන්නා ලදි.

(ආ) අදාල ණය අයකර ගැනීම සඳහා ණය සනාථන කැඳවීම් ලිපි යවා ඇත.

(ඇ)

(ඈ) එකඟ වේ.

(ඉ) 2015 වර්ෂය වන විට සතොස විසින් වී අලෙවි මණ්ඩලය වෙත ගෙවීමට ඇති ශේෂය සහ සතොස පොත් පත් අනුව ශේෂය එකඟ කරගෙන ඇත.

(ඊ) මේ සමඟ 2012 වර්ෂයේ ගිණුම් වල ගැළපුම් කිරීමට සටහන් කර ගෙන ඇත.

2.2.8 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

(අ) 2012 වර්ෂයේ ගිණුම් වලට අදාළව ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ)

2.2.9 නීති, රීති, රෙගුලාසි හා කළමණාකාරීත්ව තීරණ වලට අනුකූල නොවීම

(අ)

(ආ)

(ඇ) මෙම ආයතනය සතොස පූර්ණ අයිතිය ඇති සමාගමක් වන බැවින් සතොස ආයතනයේ නිලධාරීන් එම සමාගමේ තනතුරු සඳහා වැඩ බලන නිලධාරීන් ලෙස පත් කර ඇත. එසේ නොමැතිව එම තනතුරු සඳහා බාහිර බඳවා ගැනීම් සිදු කළහොත් ඒ සඳහා විශාල වැටුපක් සහ දීමනා ගෙවීමට සිදු වන බැවින් එම සමාගම විසින් සුළු දීමනාවක් ගෙවීමෙන් අදාළ නිලධාරීන්ගෙන් සේවය ලබා ගෙන ඇත.

2004 වාර්ෂික ගිණුම් වාර්තාවට අනුව සමාගම් ආරම්භ කිරීම සඳහා කැබිනට් අනුමැතිය ලැබී ඇති බවත්, එයින් සමාගම් කිහිපයක් පමණක් සංස්ථාපනය කර ඇති නමුත්, ඒවායේ ව්‍යාපාර කටයුතු ආරම්භ නොකරන ලදි. ඒ අනුව ප්‍රතිපත්තියක් වශයෙන් සමාගම් පනතට අනුව සමාගම් සංස්ථාපනය සඳහා සතොසට අනුමැතිය ලැබී ඇති බැවින්, මෙම සමාගම් පිහිටුවීම නීති විරෝධි නොවන බවත්, රාජ්‍ය ප්‍රාග්ධනය නොයොදවා එම ආයතනයෙන්ම ප්‍රාග්ධනය සපයා ගන්නා සතොස වැනි ආයතනය වලට එකී ප්‍රාග්ධන සමාගමක ආයෝජනය කිරීම නීත්‍යානුකූල වේ.

තවද 2002 වර්ෂයේ ආරම්භ කරන ලද සමාගම් වල ව්‍යුහාත්මක අවශ්‍යතාවය අනුව මෙම සමාගම් නැවත ප්‍රතිෂ්ඨාපනය කර ඇත. 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුව තනි පුද්ගල සමාගමක් පිහිටුවීමේ ප්‍රතිපාදන යටතේ සතොස ට පූර්ණ අයිතිය ඇතිසේ වෙනත් කොටස් හිමියන් නොමැතිව මෙම සමාගම් පිහිටුවා ඇත.

(ඈ) සතොස ආයතනයට සම්පූර්ණ හිමිකමක් ඇති සමාගමක් නිසා මෙම මුදල එම සමාගම වෙනුවෙන් වියදම් කර ඇත. මේ වන විට අදාල සමාගම වෙත ලබා දුන් ණය මුදල් සතොස වෙත මුළුමනින්ම ගෙවා ඇත.

3 මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

(අ)

(ආ)

(ඇ)

(ඈ)

4. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

4.1 <u>භෞතික කාර්ය සාධනය</u>

(අ) ඉදිරියේදී නිවැරදි කිරීම සඳහා සටහන් කර ගතිමි.

(ආ) ඉදිරියේදී නිවැරදි කිරීම සඳහා සටහන් කර ගතිමි.

(ඇ) ඉදිරියේදී නිවැරදි කිරීම සඳහා සටහන් කර ගතිමි.

4.2 <u>කළමණාකරන අකාර්යක්ෂමතා</u>

(අ)

(ආ)

(ඇ) සතොස ආයතනය සතු ගොඩනැගිලි සහ වෙනත් දේපළ ලංකා සතොස ආයතනයේ මූලික ආරම්භ කරලීමේ කටයුතු සඳහා යොදවනු ලැබීය. සතොස ආයතනයේ ද දායකත්වයෙන් පිහිටවනු ලැබූ රාජ්‍ය සමාගමක් ලෙස ලංකා සතොස වෙත මෙම ගොඩනැගිලි බදු පදනම මත දෙන ලද අතර, පසු කාලයේදී කුලිය සංශෝධනය කිරීමදාල ප්‍රදේශ වල බදු කුලිය පිලිබඳ වෙළඳපොළ අගයන් සැළකිල්ලට ගනිමින් සිදු කර ඇත. (මෙම සියළුම ගොඩනැගිලි සඳහා රජයේ තක්සේරු දෙපර්තමේන්තුව මගින් තක්සේරු වාර්තා ලබාගැනීමේදී ගතවන කල් ප්‍රමානයන් හා ඒ සඳහා ගෙවීමට සිදු වන විශාල පිරිවැය ගෙවීමේදී මතුවන මූල්‍ය දුෂ්කරතා මෙහිදි සැළකිල්ලට ගෙන ඇත.)

(ඈ), (ඉ) සතොස විසින් ලංකා සතොස වෙත ආයෝජිත රු.121,708,710.23 ක් වූ සම්පත් වෙනුවෙන් කොටස් හිමිකම් ලබා ගැනීම සඳහා අමාත්‍යාංශ ලේකම්තුමා විසින් කමිටුවක් පත් කරන ලදි. ඒ සඳහා අදාල තොරතුරු සහ වාර්තා ඉදිරිපත් කිරීම අප විසින් සිදු කර ඇත. මෙහි පළමු කොටස් නිකුතුව සිදු කර ඇති බව දන්වමි.

(ඊ) 2012 වර්ෂයේ ජනවාරි මස අදාල අර්ථසාධක අරමුදලේ ගෙවීම් කටයුතු සිදු කර ඇත.

4.3 ආර්ථික නොවන ගණුදෙනු

(අ) ඉන්ග්‍රීන් ඉන්ස්ටියුට් ඔෆ් ප්‍රින්ටින් ඇන්ඩ් ග්‍රැෆික්ස් සමාගම විසින් සඳහන් කාලපරිච්ඡේදය තුලදී කිසිදු ලාභාංශයක් ප්‍රකාශ කර නොමැති අතර, (Not declaired) අදාල ආයෝජනය අදාල කොටස් ප්‍රමාණය නැවත මිළදී ගන්නා ලෙස අප සංස්ථාව විසින් ඉන්ග්‍රීන් ආයනය වෙත ඉල්ලීමක් සිදු කළ ද, ඔවුන් විසින් අප වෙත දන්වා ඇත්තේ (ඇමුණුම 01) ඔවුන් විසින් නිකුත් කර ඇති කොටස් වෙනුවෙන් මුදල් ගෙවීමක් එම ආයතනය වෙත සිදු නොකර ඒ වෙනුවෙන් ඔවුන්හට මේ වන විට එම ආයතනය පවත්වා ගෙන යන ඉඩම සහ ගොඩනැගිල්ල අගය (Valuvation) කර සංස්ථාව විසින් ලබා දී ඇති බවයි.

තවද 2011 වර්ෂයේ ගිණුම් වල සටහන් අංක 10 යටතේ මේ සම්බන්ධ හෙළිදරව් කිරීමක් සිදු කර ඇත.

(ආ) මෙම වියදම් තුල ආයතනයේ සේවය කරනු ලබන කාර්ය මණ්ඩලය වෙත දෛනිකව ලබා දෙන තේ වියදම් සඳහා වැය වූ රු.1,076,286/- ක් මෙහි ඇතුලත්ව වී ඇත.

4.4 ප්‍රතිව්‍යුහගත කිරීමේ ගණුදෙනු

මේ සම්බන්ධ විස්තරාත්මක හෙළිදරව් කිරීමක් 2012 ගිණුම් තුල සිදු කිරීමට කටයුතු යොදා ඇත.

4.5 දූෂණ වංචනික ගනුදෙණු

2009 සහ 2010 වර්ෂයන්හීදී සිදු කරන ලද බේකරි වෙළඳාමෙන් රු.1,321,285/- ක මුදලක් වංචා කර ඇති බවට රජයේ විගණන වාර්තාවන් පෙන්වා දී ඇති කරුණු ද පදනම් කරගෙන අදාළ නිලධාරීන්ට අදාලව එම විනය පරීක්ෂණය දැනට සිදු වෙමින් පවතින අතර, විනය පරීක්ෂණය අවසානයේදී පරීක්ෂණ නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තාවන් පදනම් කර ගනිමින් තීරණයක් ගැනීමට නියමිතය. මෙයද 2014.03.07 දින පැවති පොදු ව්‍යාපාර පිලිබඳ කමිටුවේදී විමසන ලද කරුණක් වන අතර, විනය පරීක්ෂණ වල ප්‍රතිඵල COPE වෙත වාර්තා කිරීමට නියමිතව ඇත.

4.6 අසම්භාව්‍ය වගකීම්

2012 වර්ෂයේ ගිණුම් තුල හෙළිදරව් කිරීමට සටහන් කර ගතිමි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 මූල්‍ය ප්‍රකාශණ ඉදිරිපත් කිරීම

5.2 සංයුක්ත සැලැස්ම

මේ වන විට පිළියෙල කර ඇත. කාලානුරූපව වෙනස්කම් සිදු කර ඇත.

5.3 ක්‍රියාකාරී සැලැස්ම

වාර්ෂිකව අදාල ප්‍රතිපාදන යටතේ පිළියෙල කර ඇත.

5.4 අයවැය පාලනය

.

6. පද්ධති පාලනය